# KIRALA SANDESAYA.

# කිරළ සන්දේශය.

අළුත්ගම

ආඬ්බුවේ සවභාෂා පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය

ජේ. පී. රණසිංහ මහත්මයාගේ

ශිෂ්‍ය වූ

මෙමාරැත්තේ

වී. ජුවානිස් පෙරේරා අප්පුහාමි

විසින් විරචිතයි.

ඩී. පී. දිසානායක අප්පුහාමි විසින්

අච්චුගස්වා ප්‍රසිද්ධ කරණ ලදී.

කුරුණෑගල

චන්ද්‍රාලෝක යන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

1900.

# කිරල සන්දේශය.

මෙම කිරල පක්ෂියෙකු දූත මෙහෙවරෙහි යොදා කළ හෙයින් කිරල සන්දේශ නම්, මෙහි කර්තෘවරයානම් අනේකාකාරයෙන් ලෝවැඩකරයන්නාවූ බී. සී. ජී. ආටිගල මුදලිතුමාහට පිහිට ආරක්ෂාවවූල්ලා ඒතුමාගේ කළමනාකාර තැන්පත් මෝතිස්සිල්වා නම් මහතාවිසින් ශ්‍රීවිෂ්ණු දිව්‍යරාජයාවෙත කිරල්පක්ෂියෙකු දූත ක්‍රියාවෙහි යොදා යැවීමයි. මෙහි පළමුවෙනි ගීයෙන් එම පක්ෂියාට ආමන්ත්‍රණය කිරීමද, 2 වෙනි සැහැල්ලෙන් ඔහුගේ ගුණවර්ණනා විශේෂයද' 3 වෙනි 4 වෙනි කවිදෙකෙන් ඔහු මේකටයුත්තෙහි යෙදීමේ කාව්‍යකර්තෘහුගේ ප්‍රසන්නතාවයද, 5වෙනි 6වෙනි කවිදෙකින් ඔහුට නියෝගකිරීමද, සත්වැන්නපටන් 14දක්වා ඔහු පිටත්වියයුතු කුරුණෑගල පුර වර්ණනාවද, 15 වැන්න එයින් පිටත් විමට නියොගද, සොළොස් වැන්න පෙරමඟ දක්නයුතු සුභනිමිත්තයන්ද, 17වැන්නපටන් 81දක්වාමාර්ග වර්ණනාව සමග වනවර්ණනා ස්ථානවර්ණනාහා සඬනවර්ණනා ආදියද, 82 පටන් 90දක්වා ප්‍රවේශස්ථානයවූ කැලණිපුර වර්ණනාවද. 91 පටන් 93 දක්වා දෘගැබ් ආදිය වන්දනාවට නියොගද 94 පටන් 110 දක්වා දිව්‍යරාජයාගේ වර්ණනාව ඔහුපාද නමස්කාරකිරීමේ නියොග සහ තමන් ගිය කටයුතු අඟවන්ට නියෝගද, 111 සුරෙන්ද්‍රයා හට ආමන්ත්‍රණකයද, 112පටන් 113දක්වා මේ සන්දේශය යෙදූ මෝතිස් සිල්වා මහතාගේ ගුණ විශේෂයහා අස්නප්‍රකාශකිරීමේ ආරම්භයද, 114පටන් 121දක්වා යථොක්ත මුදලිතුමාගේ ගුණවර්ණනාතිශයහා එතුමන් රක්ෂාකිරීම පිණිස දිව්‍යරාජයාට ආයාචනාවද, 122 එසේම ශ්‍රී දේවියට ආයාචනා කිරීමද, 123 දූතක්‍රියාවෙහි යෙදූ කාරණාව පක්ෂියාට ආශිවාදද දක්වන ලදී.

මේ වගට,

ඩී. පී. දිසානායක අප්පුහාමි.

# ශුද්ධි පත්‍රය.

———00———

| පිටුව | පෙළේ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 19 | වෙහෙක් | වෙහෙසක් |
| 2 | 12 | නිරන්තයෙන් | නිරන්තරයෙන් |
| 4 | 20 | උෟෂ්ණකාරත්හොත් | උෂ්ණකරත්හොත් |
| 5 | 6 | ඒකාකාරයි | එකාකාරයි |
| 8 | 14 | මිහිර් | මිහිර |
| 9 | 28 | ගහණ | ගහන |
| 10 | 2 | ගහණ | ගහන |
| 11 | 6 | ඉදල | ඉදලා |
| ,, | ,, | යොහගයවූ | යොහනයවූ |
| 12 | 31 | පත්තාගමෙන් | |
| 19 | 16 | දිවවර | දියවර |
| 21 | 17 | මුඵ | මුලු |
| 23 | 10 | හසනලයෙන් | හසානලයෙන් |
| 24 | 16 | වගීයකිරීමද | වගීකිරීමද |
| ,, | 21 | තියනින් | තියමින් |
| 25 | 16 | පාදපවත්නාවූ | පාදපවත්වන්නාවූ |
| 30 | 26 | එපිට | එපිටවබු, ඇතයව; |
| 37 | ,, | විජෘම්භමාන | විජෘම්භමාණ |
| 37 | 21 | වැති | වැතිය |
| 43 | 16 | ආද්‍ර | ආද්‍රවූ |
| ,, | 33 | අප්‍රමානවූ | අප්‍රමාණවූ |
| 44 | 19 | විජෘම්භමානවූ | විජෘම්භමාණවූ |
| 45 | 15 | සතත්ගෙන | සතත්ගෙණ |
| 47 | 9 | අග්‍රමෙහෙසිකාවවූ | අග්‍රමෙහෙසිකාවූ |
| ,, | 14 | පතල | පතල |
| ,, | 20 | කරණවෙන් | කරුණවෙන් |

සන්න සහිත

# කිරළ සන්දේශය.

1 සැරද කිරළිඳු සඳ—බොලු පැහැපතින් කල්වන්,
සුමියුරු නදින් හදහද—කළ සව්සතන් මෙදියේ.

1 "කිරළිඳුසඳ සැරද" යනු මෙහි වාක්‍ය යොජනායි– කෙබඳු කාරණ්ඩ පක්‍ෂිරාජයෙක්ද යත්- බොලුපැහැ, බොල් ලත්ශේප්‍රභාවෙන්(යුක්තවූ)පතින්, පක්‍ෂපත්‍රයන්ගෙන්; කල් වන්, කාන්තවූ; සුමියුරුනදින්, ඉනාමිහිරිනාදයෙන්; මෙදි යේ, මේජගත්හි; සව්සතන්, සකලසත්‍වයන්ගේ; හද, හෘදය; නදකළ, සන්තුෂ්ටකළාවූ; කිරළිඳුසඳ, කාරණ්ඩපක්‍ෂි රාජෝත්තමය; සැරද, චිරකාලයක් ජීවත් වෙහිවා.

2 මුලු දදුන් ගෙනු තුම්—සරණාදිය තලන්හි
පබල කුරෙව් තගෙ තුඩගණ රතින්දි ලි
පතුල කසුන් පැහැයුරු මල් කෙසර තු ලි
සුපුල් හෙල පියුමැසි—ඉන් තුබ නැගි එනසඳ
ලුහුබැඳබැඳ අලිවට නොකලෝද තො සේ
වනපුර අගනෝ නොපැලඳියෝද කෙ සේ
විතර කල නොනැසී තුනුරුසිරු කැ විය
මියුරු නදින් සවණට අම පිබු සැ විය
නිතර එබත්නෙත් ලෙව්වැසියන් අ විය
අතර මගදි වෙහෙක් නුනෙද පැ විය

2 දියතලන්හි, ජල තටාක යන්හි; සරණ, සංචාරණය කරන්නාවූ; මුලුදදුන්ගෙන්, සියලුපක්‍ෂීන්ගෙන්; උතුම්, උත් තමවූ; තගෙ, ගුෂ්මත්හුගේ; ගනරතින්, ඝනරක්තවර්ණ යෙන්; දිලි, උජ්ජ්වලිතවූ; තුඩ, චංචුව; පබලකුරෙව්, ප්‍රවා ලාඞ්කුරයක් වැනිය; කසුන්පැහැයුරු, කාඤ්චනප්‍රභාකාරවූ;

පතුල, (සුත්ව) පාදතලයා: මල්කෙසරතලී, පුෂ්ප කෙශර යන්සමානා; ඉන්, එසේහෙයින්; නුබනැති, ආකාශයට ආරූඪව: එනසඳ, එනකල්හි; සුපුෂ්, සුත්පුලලවූ; හෙලපියු මැසි, ශෝභනපත්‍රයමානැසි (සිතා) අලි, භෘඞ්ගයෝ; ලුහුබැඳ බැඳ, පස්සෙන් එලව එලවා; චටකොකලෝද, සිසාරනො ගත්තුද; වන සුර අඟනෝ, වනදිව්‍යාඞ්ගනාවෝ, කෙසේ කෙශකලාපයෙහි: නොපැලදියෝද, පිළඬනයනොකලාහුද විනරකලනොහැකි, ප්‍රමාණකලනොහැක්කාවූ; තුනුරුසිරු කැටිය, ශරීරරූපශ්‍රී සමූහයෙන්ද; සවණට, කණ්යට; අම පිඩුසැටිය, අමෘතපිණ්ඩාකෘතිවූ; මියුරු නදින්, මධුරනාද යෙන්ද; ලොවටැසියන්, ලොකවාසීන්ගේ; අවිය, ආසාව; නිනර. නිරන්තරයෙන්; වඩන්නෙන්, වර්ධනයකරණහෙයින්; පැවිය, මිත්‍රය; අතරමගදී, අන්තරමාර්ගයෙදී; වෙනෙහසක්, විතිංසනයක්; නුවෙදද, නොවූයේද.

3 පැහැ දි  වංකනු මනකල් සිතක් දු  රූ
ස බ ඳ  දහම් රකිණා සක් යුවල යු  රූ
ඉ රි දි  ලෙසින් කඩිසර හැම සඳ යතු  රූ
ම ම ද  පින්වනෙකි නොපදුටුවෙන් මිතු  රූ

3 පැහැදි, ප්‍රසන්නවූ; වංකනු, අවඩකවූ; මනකල්, මනොඥවූ; සිතක්, චිත්තයක්; දුරූ, ධාරණයකලාවූ; සක්යුවල යුරු, චක්ෂුර්යුග්මය පරිද්දෙන්; සබඳ දහම්, සම්බන්ධ (මිත්‍ර) ධර්මය; රකිනා, රක්ෂාකරන්නාවූ; හැමසඳ, සැමකල්හි; යතුරු, යාත්‍රාවෙහි; ඉදිරිලෙසින්, ඉර්ධිආකාරයෙන්; කඩිසර, වේනවත්වූ; මිතුරු, මිත්‍රය; නොප, නුඹවන්නු; දුටුවෙන්, දශීනයකලහෙයින්; මමද, අසමත්ශබ්දවාච්‍ය මම මේද; පින්වනෙකි, පූණ්‍යවන්තයෙක්මි.

4 සැ  ප  දුක දෙක  පෙරලෙන ඉටුමිතුරු ගු  ණේ
ල  ප  සඳ එකලෙස පවතියි සියළු දි  නේ
අ  ප  කටයුතු සිදුකරදෙන විලසප  ණේ
නො ප  ඇර මිතුරෙක් නැත මෙදියනෙහිවෙ  නේ

4 ඉටු මිතුරුගුණේ, ඉෂ්ටමිත්‍රගුණය; සැපදුකදෙක, සුඛ දුඃඛවය; පෙරලෙන, පරිවර්තනයවනකල්හි; සඳලප, මඬ

ලාංඡනයහා; එකලෙස, එකාකාරව; සියලුදිගින්, සෑමදවස්හි; පවතිය, පවත්නේය; (එකාකාරගුණඇතිවූ පණ, ප්‍රාණය; අපකාවයුතු, අපගේ කෘතිව්‍යය; සඳසර. සිඩගොට; දෙන විලස, දෙන විලාසයෙන්; මෙදය තොනි, මේ ලෝකයෙහි; නොපඇර, යුෂ්මත්හු විනා; වෙනේ, අන්‍යවූ; මිතුරෙක්, මිත්‍රයෙක්; නැත, නැත්තේය.

5 එබැවින් එයමෙනෙහිකොට ගුණයුත් මිතු ර
තරයෙන් තොප සිතෙහි සොම්නස් පහළක ර
නියතින් ඔබට වැඩවන විලසින් නිත ර
සිහියෙන් අසව මකියන බස කර අද ර

5 එබැවින්, එසේහෙයින්; ගුණයුත්, (පළමුකීලෙස ඉෂ්ට මිත්‍ර) ගුණයෙන්යුක්තවූ; මිතුර, මිත්‍රය; එය, තතකතිව්‍යය; මෙනෙහිකොට, සලකාගෙණ; තරයෙන්, ස්ථිරයෙන්; තොප සිතෙහි, යුෂ්මත්හුගේචිත්තයෙහි; සොම්නස්, සෞමනස්‍යය; පහළකර ප්‍රාදුර්භූතකොට; නියතින්, ඒකාන්තයෙන්; ඔබට, (මතුවට) ඔබබට; නිතර, නිරන්තරයෙන්; වැඩවන විලසින්, අභිවෘද්ධිපැමිණෙනසේ; මකියන, මාවිසින් කියනු ලබන්නාවූ; බස, වචනය; අදරකර, ආදරකොට; සිහියෙන්, සමෘතියෙන්; අසව, ශ්‍රවණය කරව.

6 සුනෙරසිරේ පුර එකසරිවූ නොමි න
ඉසුරු බරේ පිරි නිති දෙවියන් රඳ න
කැලණිපුරේ රජමහ වෙහෙරට පැමි ණ
සතර කරේ සුරිඳුට දෙව මෙහසු න

6 සුනෙරසිරේපුර, මේරුශිඛීයෙහි(පිහිටියාවූ)පුරයහෙවත් දිව්‍යපුරයහා; එකසරිවූ, එකසමානවූ; නොමින, බොහෝවූ; ඉසුරුබරේ, ඓශ්වර්‍ය්‍යභාරයෙන්; පිරි, සම්පූර්ණවූ; නිති, නිරන්තරයෙන්; දෙවියන්, දේවතාවන්; රඳන, රඤ්ජමානවූ; කැලණිපුරේ, කල්‍යාණීපුර යෙහි; රජමහවෙහෙරට, රාජමහවිහාරයට; පැමිණ, ප්‍රාප්තව; සතර කරේ සුරිඳුට, චතුර්භස්ත සුරෙන්ද්‍රයාට; මෙහසුන, මේ සන්දේශය; දෙව, දානය කර.

7 දෙවොහානට පත් සිතුමිණි රුවනක් පු රුව
මෙමෙහෙය ට ලැදිවිමෙන් මගෙ සිත පි රුව
ප සු ව ට පවසමි එහසුන් විසිතු රුව
මෙ හි සි ට මග සල කුණු අස වැඩක රුව

7 දෙවොහානට, භගවානට; පත්, ප්‍රාප්තවූ; සිතුමිණිරුව නක්පුරුව, චින්තාමාණික්‍යයක්පරිද්දෙන්; මෙමෙහෙයට, මෙමෙහෙ කිරීමපිණිස; ලැදිවිමෙන්, කැමතිවීමෙන්; මගෙසිත, මාගේ චිත්තය; පිරුව, පූර්ණකලාවූ; වැඩකරුව, වෘද්ධිකාරකය; එහසුන්, ඒසංදේශවාක්‍යය; පසුවට, පශ්චාත්කාලයෙහි; විසිතුරුව, විචිත්‍රකොට; පවසමි, ප්‍රකාශකරමි; මෙහිසිට, මෙතැන්පටන්; මග, මාර්ගයාගේ; සලකුණු, සංලක්ෂණයන්; අස, ශ්‍රවණයකර.

8 දි නු සුරපුර නොමද සව්ඉසුරෙන් සපි රූ
ඊ ණු කරනොත් හැකි වන අස්න පුරඳු රූ
තු නු රුවනින් සැදි දන රඳන තිරතු රූ
ද නු මමිතුරු ඇතුගල පුරවර සොඳු රූ

8 සපිරූ, සම්පූර්ණවූ; නොමද, බොහෝවූ; සව්ඉසුරෙන්, සකලෛශ්වර්‍ය්‍යාභරණකාවගෙණ; සුරපුර, දිව්‍යපුරය; දිනු, ජයගත්තාවූ; පුරඳුරු අස්න, පාඩුකම්බලශෛලාසනය; ඊණු කරනොත්, ඊර්ෂ්‍යාකරත්නොත්; හැකිවන, සමර්ථවන්තාවූ; තුනුරුවනින්, ත්‍රිවිධරත්නයෙන්; සැදි, සජ්ජිතවූ; දන, ජනයා; රඳන, රංජමානවූ; සොඳුරු සුන්දරවූ; ඇතුගල පුරවර, හස්තිශෛල පුරප්‍රවරය; මමිතුරු, මාගේ මිත්‍රය; දනු, ඥාන නය කර.

9 තු ගු තු ල් දද ගුරුළුත් සෙව් අඹර යු තී
බි තු නි ල් මිණිතර දල කද පිරිපැහැ තී
ගජ් සෙ ල් මුදු පසු කර කර දිවන නි තී
ම න ක ල් හයපුර සමුදුර රලෙක යු තී

9 මනකල්, මනොඥවූ; හය, අශ්වයෝ (කෙසේද) තුගු, උස්වූ; දද, ධ්වජනැමත්; ගුරුළුන්, ගරුඩාත්විසින්; සෙව්, සේවනයකරණ ලද්දාවූ; අඹරයුතී, ආකාශයෙන් යුක්තවූ;

පැහැති, ප්‍රභාවිත්වූ; තිකු, තික්හිටල; නිල්මිණිනර; නීල මාණික්‍යරශ්මිනැමති; දළකද, ජලසේකාඞ්ගෙන්; පිරි, සම්පූර්ණවූ; ගජ, හස්තිනැමති; සෙල්මුළු, ශෛලසමූහයන්; පසු සැරකර; පසුකරමින්; නිති, නිරන්තරයෙන්; දුවන, ධාවනයකරන්නාවූ; පුර, නගරනැමති; සමුදුර, සමුද්‍රයෙහි; රළඑකයුති, තරඞ්ගයන් ඒකාකාරයි.

10 විසල් මෙහි පහග කොතනිල් මිණිරසි න
දුහුල් දද සුනිල් වන නිල්වලාමෙ න
මෙකල් කල් නොගොස් පැමිණෙසි සිතාගෙ ණ
ගෙතිල් ගෙල රගති නිති පිල් විදුග ණ

10 විසල්, විශාලවූ; මෙහි, මේනගරයෙහි; පහග, ප්‍රාසාදශ්‍රයන්හි; කොත, ශෘඞ්ගයන්ගේ; නිල්මිණි රසින, නීල මාණික්‍ය රශ්මියකරණකොටගෙණ; දුහුල්දද, දුකූලධ්වජයෝ; නිල්වලාමෙන, නීලවලාහකයන් පරිද්දෙන්; සුනිල් වන, ඉතානිල්ව පවත්නා කල්හි; ගෙතිල්ගෙල, ග්‍රීවා මයූරයෝ; මෙකල්, මෙසකාලය; කල්නොගොස්, කාලාතික්‍රමණයනොව; පැමිණෙසි, සම්ප්‍රාප්ත වෙයයි; සිතා ගෙණ, චින්තනයකොට; නත, සතාවූ; පිල්විදු, පිංජයන් විවෘත කොට; නිති, නිරන්තරයෙන්; රගති, නෘත්‍යයකෙරෙත්.

11 අගිලේ දුම කැලේ ඇතුලේ ලෙලෙනනිති
උදුලේ දදරලේ ගෙපෙලේ පමණ නැති
අවලේ සුරකලේ ලකලේ කෙළිනරුති
තුමුලේ හිමසෙලේ දවලේ පැහැයගති

11 අගිලේදුමකැලේ, කාලාගුරුධූමරාශියගේ; ඇතුලේ, අභ්‍යන්තරයෙහි; නිති, නිරන්තරයෙන්; ලෙලෙන, ලීලෝපෙතවන්නාවූ; දදරලේ, ධ්වජසමූහයාගෙන්; උදුලේ, උජ්වලිතවූ; පමණනැති, අප්‍රමාණවූ; ගෙපෙලේ, ගෘහපඞ්ක්තිය තොමෝ; රුති, රුචියෙන්; කෙළින, ක්‍රීඩා කරනනාවූ ලකලේ, අලඞ්කෘතවූ; සුරකලේ, දිව්‍යාඞ්ගනාවන්ගෙන්; අවලේ, ගැවසීගත්තාවූ; තුමුලේ, මහත්වූ; දවලේ, ධවලවූ; හිමසෙලේ, හිමාලපර්වතයාගේ; පැහැය ,සෝභාව; ගති, ගත්තාය.

12 පිරි පිය පුරෙ රත් පැරදීමෙන් සි තෝ යා
විලි වැද ගියෙන් වන විලසේ ප තෝ යා
ගළි එනලෙසින් ගඟ දිගුවිල් වෙ තෝ යා
ලිහයෝ නනපවින් බැඳ වසතැයි සි තෝ යා

12 සේපතෝයා, (ශෝභන) හංසයන්; පිරි, පූර්ණවූ; පිය පුරෙරත්, පයෝධරයෙන්; පැරදීමෙන්, පරාජිත වීම කාරණ කොටගෙණ; සිතෝයා, චින්තනයෙහි; විලිවැද, ලජ්ජාවහට ගෙණ; වනවිල, වනාන්තවාපිකායට; ගියෙන්, ගියහෙයින්; ගළි නැවත; ගඟදිගුවිල්වෙතෝයා, ගංගාදීර්ඝකාන්තවාපිකායන්තර එනලෙසින්, ආගමනානුපිණිය: ලිහයෝ, (නගර) ස්ත්‍රීයෝ; නන, පයෝධරයන්; පවින්, පයෝධරපට්ටයෙන්; බැඳ, බන්ධනය කොට; වසතැයි, වසත්යයි; සිතෝයා, චින්තනයේවි.

13 කැ ම ති කැමති විලසින් පාමින් කොම ල
පෙ මැ ති කර සතත්වෙත අදිමින්සලෙ ල
පැ හැ ති පන්දු ගෙණ ගෙතු කුසුමෙන් ලකල
කෙ ළි ති සොඳුරු අඟනෝ මෙහි සඳලුව ල

13 කැමතිකැමතිවිලසින්, යථාභිරුචි පරිද්දෙන්; කොම ලපාමින්, කෝමලදක්වමින්; පෙමී, ප්‍රේමය; ඇතිකර, විද්‍යමානකොට; සලෙල, සල්ලාලයන්ගේ; සතත්, සන්තානයන්; වෙත, සමීපයට; අදිමින්, ආකර්ෂණයකරමින්; කුසුමෙන්, පුෂ්පයෙන්; ගෙතු, ගොතනලද්දාවූ; ලකල, අලංකෘතවූ; පැහැති, ප්‍රභාමත්වූ; පන්දු, කන්දුකයන්; ගෙණ, ග්‍රහණයකොට; අඟනෝ, ස්ත්‍රීහු; මෙහි, මේනගරයෙහි; සඳලුවල, චන්ද්‍රිකාශාලාවන්හි; කෙළිති, ක්‍රීඩාකෙරෙත්.

14 ම නා ලෙස පැලඳ දිලි මිණි මුතු බර ණ
ද නා හද අදන තෙක අඟනෝ තරු ණ
ත නා පල ඇඟිලි තොල් තඹපලු රුගෙ ණ
කා නා ලිහත් වැනි විය පුරතුල සර ණ

14 මිණි මුතු බරණ, මණිමුක්තාභරණයන්; මනා ලෙස, යහපත්සේ; පැලඳ, පිලන්ධනය කොට; දිලි, දීප්ති මත්වූ; දනා, ජනයන්ගේ; හද, හෘදය (සිත) අදනා, ආකර්ෂණය කරන්නාවූ; තෙක, බොහෝවූ; තරුණ, තරුණවූ; අඟ

තෝ, සත්‍වූ; තනාල, පයොධරඵලද; ඇඟිලිතොල් තඹ පලු, අඞ්ගුල්‍යාධර තාම්‍රපල්ලවද; රැඳගෙණ, හැරගෙණ; පුර තුළ, නගරාභ්‍යන්තරයෙහි; සරණ, සංචාරණයකරන්නාවූ; කතාලියන් මැනිවන, කන්‍යාකලනාවන් වැන්නාහුය.

15 උ දු සුරඇදුරු සිසිපත් තල රැසි නී
උ දු කර තඹිරු හිරුදින පුසන තී නී
යො දු තුනු රුවන් ගුණ සිත සත තොසි නී
වි දු පියා යව මෙපුරෙන් නුබපැමි ණී

15 උදු, උදිතවූ; සුරඇදුරු, බෘහස්පතිහා; සිසි, චන්ද්‍රයා; පත්, ප්‍රාප්තවූ; තලරැසිනි, කටකරාශියෙහියුක්තවූ; පුසන තිනී, පුෂ්‍යනැකතින්; හිරු, සූර්‍ය්‍යයා; හිරුදින, දිවාකර දිනය; උදුකරන, හෙලිකරන්ම; තුනුරුවන් ගුණ, ත්‍රිවිධ රත්නානුභාව; සිත, චිත්තයෙහි; යොදු, යොජිතකොට; සත තොසිනි, සන්තොෂයෙන්; පියාවිදු, පක්ෂ පත්‍රයන් විදහා; නුබපැමිණී, ආකාශයට නැගී; මෙපුරෙන්, මේනගරයෙන්; යව, ප්‍රයාණයකර.

16 සි කි පි ල් නෙළුකමල් නිලුපුල් මුතුපබ ල
සු නි ම ල් තිසර දිය කලු මල් දම් උදු ල
ම න ක ල් රත්නැඹිලිමල් සුවඳ ඇල්න ල
මෙසි ය ල් සුබනිමිති බලු පෙරමඟ කිර ල

16 සිකිපිල්, මයූරපිංඡය; නෙළුකමල්, ශ්වෙතපද්මය; නිලුපුල්, නිලොත්පලය; මුතු, මුක්තාය; පබල, ප්‍රවාලය; සුනිමල්, ඉතානිර්මලවූ; තිසර, හංසයා; මල්දමින්, මාලා දාමයෙන්; උදුල, බබලන්නාවූ; දියකලු, ජලඝටය; මන කල්, මනොඥවූ; රත්නැඹිලිමල්, කනක සන්නීර පුෂ්පය; සුවඳ, සුගන්ධවත්වූ; ඇල්නල, සිසිල්සුලංග (ඌන) මෙසියල් සුබනිමිති, මේ සකල සුභ නිමිත්තයන්; කිරල, කාරණ්ඩ පක්ෂිය; පෙරමග, පූර්වපථයෙහි; බලු, නිරීක්ෂණය කර.

17 සෙලේ සිඳුරු රූ වැනි මුදුනෙහි රුව ට
බ ලේ විලස කල පෙරදෙව් ගැහිත්සෙ ච
ම ලේ දවන දුම්කඳ නැගී නුබ අව ට
ග ලේ බණ්ඩාර කෝවිලු පෙණෙසි න ච

17 සිඳුරුරූවැනි, සින්ධුරරූපාකාරවූ; සෙලේ, ශෛල

යාගේ; මුදුනෙහි, මස්තකයෙහි; පෙර, පූර්වකාලයෙහි; සෑම දෙව්ගැතින්, ශ්‍රේෂ්ඨදේවගැතියන් විසින්; බලේවිලස, බල වත්ලෙසින්; රුවට, යහපත්සේ; තළ, කරණලද්දවූ, අවට, හාත්පසින්; තුබතෑගි, තබගොත්ගතවූ; දවන, දවන්නාවූ; මලේ, (යක්ෂධූපාදි) මැලියම්වර්ගයන්ගේ; දුම්කඳ, ධූමස්කන්ධයන්ඇත්තාවූ; ගලේ බණ්ඩාර කෝවිල, එනම් දේවාලය; තට, යුෂ්මත්හුට; පෙණේස්, දෘශ්‍යමානවෙයි.

18 ගණනිල් ඈමිය අතුපතරින් දිලිනිතොර
මිහිලොල් කැමිය නදයුතු සවණට මිහිර
කළුගල් සිවිය වැනි ගජරළ වැද අතර
බලමල් පිවිය රඹවතු පෙළ සැදි අයුර

18 ගන, මේඝයාගේ; නිල්ඈමිය, නීලාකාරවූ; අතුපතර ශාඛාසමූහයෙන්; නිතොර, නිරන්තරයෙන්; දිලි, දීප්ති මත්වූ; සවණට, කර්ණයට; මිහිරි, මධුරවූ; මිහිලොල්කැමිය ශබ්දසමූහයාගේ; නදයුතු, නාදයෙන්යුක්තවූ; අතර, අභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව; සිවිය, සිවියාවූ; ගජරළවැනි, හස්තිසමූහයාබඳු; කළුගල්, කෘෂ්ණ ශෛල යන්ගෙන් යුක්තවූ; රඹවතුපෙළ, රම්භාවනපඞ්ක්තිය; මල්පිවිය, එනම් ග්‍රාම යෙහි; සැදිඅයුර, සජ්ජිතවූ ආකාරය; බල, නිරීක්ෂණයකර,

19 අවුතර කර ගැණුමට වෙහෙසෙමින්බලි
වටකර දඬු වැට බැඳ අවුරා තුමුලි
කවුසර ගොවිතැන් කළ වතු පෙළින් දිලි
පොතුහැර දූක පසුකර යව නොවීමැලි

19 අවුතරකරගැණුමට, අවුස්පිරසරගැණීමට; බලී, බලවත්ව; වෙහෙසෙමින්, වෙහෙසවෙමින්; වටකර, හාත්පස; අවුරා, ආවරණයකොට; තුමුලී, මහත්වූ; දඬුවැට, දණ්ඩමයවෘතිය; බැඳ, බන්ධනයකොට; කවුසරගොවිතැන්කළ, කවුසරභෝගකළාවූ; වතුපෙළින්, වතුපඞ්ක්තියෙන්; දිලි, උජ්ජ්වලිතවූ; පොතුහැර, එනම්ග්‍රාමය; දූක, දර්ශනයකොට පසුකර, පසුකොට; යව, ප්‍රයාණයකර.

20 සිනිඳු තන ප ටි න් පිසනැඟි බා බි න් දු
නිබඳ වැද පිය න් මැද නෙලනා ල න් දූ
කියනසොඳ නදි න් යුතු ලිය ගි සි න් දු
අසව සත තොසි න් මොහොතක් කිරළි න් දූ

20 නැගි, (ශරීරයෙහි) උද්ගතවූ; බාබින්දු, ශෝද බින්දූන්; සිනිඳු, සනිග්ධවූ; තනපටින්, පයෝධරපට්ටයෙන්; පිස, පිසූජනයකොට; නිබඳ, නිරන්තරයෙන්; පියන්මැද, සෞත්‍රුමධ්‍යයට; වැද, ප්‍රවිෂ්ටව; නෙලනා, නෙලන්නාවූ; ලන්දූ, ස්ත්‍රීන්විසින්; කියන, කියනු ලබන්නාවූ; සොඳ නදින්, රසපත්නාදයෙන්; යුතු, යුක්තවූ; ලිය ගිසින්දු, ලයාන්විතගිහිකාංසින්දූන්; කිරළින්දු කිකීපක්ෂිරාජය; මොහොතක්, මුහූර්තකාලයක්, සනතොසින්, සන්තෝෂයෙන්; අසව, ශ්‍රවණය කර.

21 උණ බඩව ල් කලගෙඩිමෙන් නෙරාග ණ
වණ පිළිය ල් කඩපිළියෙන් වසා ග ණ
පිටි සර ක ල් බාමුල මලු ගසාගෙ ණ
බලසකි පො ල් ගහවෙල බඹුනිසා එ න

21 උණබඩවල්, උෂ්ණෝදරයන්; කලගෙඩිමෙන්, ඝටාකාරයෙන්; නෙරාගෙණ, උන්නතකොටගෙන; වණපිළියල්, ව්‍රණපිළිකාවන්; ගන, ඝනවූ; කඩපිළියෙන්, වැරහැලියෙන් වසාගෙණ, ප්‍රතිච්ඡාදනකොට; බාමුල, බාහුමූලයෙහි (කිසිල්ලෙහි) මලුගසාගෙණ, මලුගන්වාගෙණ; බඹුනිසා, භාණ්ඩයන්පිණිස; පොල්ගහවෙල, එනම්ග්‍රාමයකරා; එන, එන්නාවූ; පිටිසරකල්, පිටිසරකාන්තාවන්; සකි, යහලුව; බල නිරීක්ෂණය කර.

22 දි ලෙ න පුලිඟු විදුලිය විටවිට විදෙ න
බ ම ණ යතුරු වැර සුලගෙහි මැද පැමි ණ
ග හ ණ මයින් මොනරුන් සිත්ගෙණසොඳි න
ය නෙ න අසලමග බිම සොලවා නදි න

22 විටවිට, විටින්විට; විදෙන, විහිදෙන්නාවූ; පුලිඟු, විස්ප්‍රුලිංගනැමති; විදුලියා, විද්‍යුල්ලතාවෙන් යුක්තවූ; බමණ,

භ්‍රමණයවන්නාවූ; යතුරුවැර, යන්ත්‍රවාරුනැමති; සුලහෙහි මාරුතාභ්‍යයහි; මැදපැමිණ, මධ්‍යප්‍රවිෂ්ටව; ගහණ, ගහණවූ; මහින්, මගින් නැමති; මොනරුන්, මයුරයන්ගේ; සිත්, චිත්තයන්; සොඳින, යහපත්සේ; ගෙණ, ග්‍රහණයකොට; යනෙන, ගමනා ගමනය කරන්නාවූ; මග, මාර්ගයාගේ; අසල බිම, ආසන්න භූමිය; තදින, තරණේ; සොලවා කම්පා කොට.

23 ග ම් බිර ලෙස සක්නද ගිගුරුම් දෙමි න
ගි ම් රුපු කොසි ඇහිදුසි විමසන ලෙසි න
බි ම් බැස දුව ඇවිදින ගන වැහි සොබ න
දු ම් රිය වැල බල නට පෙරමග පෙණෙ න

23 ගම්බිරලෙස, ගම්භිරාකාර; සක්නද, ශඞ්ඛනාදනැමති ගිගුරුම්, ගර්ජනා; දෙමින, දානයකෙරෙමින්; ගිම්රුපු, ග්‍රීෂ්ම නැමති ශත්‍රූහු; කොසිඇහිදුසි, කොතැන්හි ඇද්දෝ හෝසි; විමසන ලෙසින, පරීක්ෂා කරණ පරිද්දෙන්; බිම් බැස, භූමියට අවතීර්ණව; දුව ඇවිදින, ද්‍රව ඇවිදින්නාවූ; ගනවැහි, මේඝසමානවූ; පෙරමග, පූර්වපථයෙහි; නට, යුෂ්මත්හට; පෙණෙන, දෘශ්‍ය මාන වන්නාවූ; දුම්රිය වැල, ධූම රථ පඞ්ක්තිය; බල, අවලෝකනය කර.

24 නොක පලතුරු උන බව දඬු මුලිනු පු ට
එ ක වෙක අවුලාගෙණ යන බොර දිය ව
සැ ක නොව අහසින් යනු හැකි බැවින් න ට
දු ක පසුකර යව සබඳිනි අලව්තො ට

24 නොක, බොහෝවූ; පලතුරු, ඵලවෘක්ෂයන්; මුලිනු පුට, මුලින්උදුරා; උනබවදඬු, උනබටදඬුහා; එකවෙක, එකින්එක; අවුලාගෙණ, ආකුලකොටගෙණ; යන, (බැස) යන්නාවූ; බොරදියට, බොරජලයට; සැකනොව, ශංකා නොවී; සබඳිනි, මිත්‍රයානනි; නට, යුෂ්මත්හට; අහසින් යනු හැකි බැවින්, ආකාශයෙන් යනු හැකි හෙයින්; අලව් තොට, එනම් නදිතීර්ථය; දුක, දර්ශනය කොට; පසුකර, පසුකොට; යව, ප්‍රයාණය කර.

25 ක ල් ස රි යේ   ඉඳ නිදිවර බලාගෙ   ණ
ව ල් පි රි යේ   එන මුව ලුහු බඳින මෙ   න
වෙ ල් හ රි යේ   සැදු පැල ගොයමින් දිලෙ   න
තු ල් ගි රි යේ   පැල්බල නැතනැත පෙණෙ   න

25 නිදිවර, (ගොවියන්ගේ) නිද්‍රාව; බලාගෙණ, බලාගණිමින්; ඉඳ, ඉඳල; සරියේ, යෙහෙක්‍යවූ; කල්, කාලයෙහි; වල් පිරියේ, තෘණප්‍රිතියෙන්; එන, ආගමනයකරන්නාවූ; මුව ලුහුබඳිනමෙන, මෘගයන්එලවනමෙන්; තුල්ගිරියේ, එනම් ග්‍රාමයෙහි; පැලගොයමින්, තරුණසශ්‍යයන්ගෙන්; දිලෙන බබලන්නාවූ; වෙල්හරියේ, ක්‍ෂෙත්‍රසීමාභ්‍යන්තරයෙහි; සැදු සජ්ජිතකලාවූ; නැතනැත, තන්හිතන්හි; පෙණෙන, දෘශ්‍යමානවන්නාවූ; පැල්බල, පැල්බලව.

26 දු ගී ප ස් ස   තුටුකලවුන් දනින් පෙ   ර
ලොබෙබි රි ස් ස   දුරහල මිහිරන් අඟ   ර
නුබෙ බි නි ස් ස   ලෙස කරමිනි පියාස   ර
අ බෙ පු ස් ස   පසුකර යා ගත් මිතු   ර

26 පෙර, පූර්වයෙහි; දුගීපස්ස, දරිද්‍රා පාර්ශවය; දනින්, දානයෙන්; තුටුකලවුන්, සන්තොෂ කල වූන්ගේ; ලොබෙබිරිස්ස, ලොභභාගේරුචිත; දුරහල, දුරීභූතකලාවූ; මිහිරන් අඟර, අභ්‍රාකාරයන්ගෙන් යුක්තවූ; අබෙපුස්ස, එනම්ග්‍රාමය; පසුකර, පශ්චාත්කොට; නුබෙබි, ආකාශයෙහි; නිස්ස ලෙස, යොග්‍යවූ පරිද්දෙන්; පියාසරකරමිනි, පක්‍ෂ ප්‍රසාරණකරමින්; මිතුර, මිත්‍රය; යාගත්, යාත්‍රාග්‍රහණයකරත්.

27 සවණ රුව න්   පත්නෙත් සරසා ගෙ   ලය
බැඳ පවල න්   විසිතුරු තුරුසේ දු   ලය
දුකසන්තොසින්   සිව්රඟ යොත් ලිය පෙ   ලය
නොසිටවඩින්   මිතුරිදු වරකාප   ලය

27 සවණ, කණ්ඨය; රුවන්පත්නෙත්, රත්නනෝඩුයෙන්; සරසා, සජ්ජිතකොට; ගෙලය, ග්‍රීවයෙහි; තුරුසේ, තාරකාපරිද්දෙන්; දුලය, බබලන්නාවූ; විසිතුරු, විචිත්‍රවූ; පවලන්, ප්‍රවාලයන්; බැඳ, බන්ධනය කොට; සිව්, සපිතවූ;

ගොත්ලිය පෙළය, ගොතක හෝ යෞවන ස්ත්‍රීසමූහා; දූත දර්ශනය කොට; සතොසින්, සන්තොෂ යෙන්; මිතුරිඳු, මිත්‍රොත්තමය; වරකාපලය, එනම් ග්‍රාම යෙහි; නොසිට, නොනැවතී; වඩිත්, ප්‍රයාණය කරත්.

28 උදුල තිලකයු තාය තලලතාය
ලුපුල් සියප තාය සවණතාය
උත් ඇල්ගෙපිකා තාය ගිරිමතාය
දකිමින්නොතැව තාය සබඳතාය

28 තිලකයුතාය, තිලකයෙන් යුක්තවූ; තලලතාය, ලලාටයෙන්ද; ලුපුල්සියපතාය, ඵුල්ලශතපත්‍රයන්; ලු, විකස සකලාවූ; සවණතාය, කණ්ණයෙන්ද; උදුල, උජ්ජ්වලිතවූ; ගිරිමතාය, පර්වතමස්තකයෙහි; උත්, උන්නතවූ; ඇල්ගෙපිකතාය, ශාලිගොපිකාඞ්ගනාවන්; දකිමින්, දර්ශනය කරමින්; සබඳ, මිත්‍රය; තෑය, තාගව.

29 ගිම්හානට ගිම්පා කරමින් තුමුල
පැන් නෑමට ගම්වැසි ගෙවුයන් අසල
බන් පාගැට යෙන් යුතු පොකුණෙන් ලකල
දන්බිවිට මන්ලෙස නරඹන් කිරල

29 ගිම්හානට, ග්‍රීෂ්මඍතුවට; තුමුල, මහත්වූ; ගිම්, ග්‍රීෂ්මය; පාකර, පහකොට; පැන්නෑමට, ජලස්නානයපිණිස ගම්වැසි, ග්‍රාමවාසීන් විසින්; ගෙවුයන්අසල, ගෘහොද්‍යාන ආසන්නෙහි; බන්, බඳනාලද්දාවූ; පාගැටයෙන්යුතු, පියගැටපඩකතීයෙන් යුක්තවූ; පොකුණෙන්, පුෂ්කරණියෙන්; ලකල, අලඞ්කෘතවූ; දන්බිවිට, එනම් ග්‍රාමය; කිරල, කාරණ්ඩවය; මන්ලෙස, සිත්වූපරිද්දෙන්; නරඹන්, නිරීක්ෂණය කරත්.

30 ඌරුකැනේ රුදින හැල් කෙත් වලට
නේතමෙනේ කාවල්ලූ මෙන් කපට
ඊදෙමිනේ බැඳි පඹ රූ දුන අවට
සානොසිනේ වෙව්ලැල් දෙනි යෙත් එපිට

30 රුදින, රුදවස්හි; හැල්කෙත්වලට, ශාලික්ෂෙත්‍රයන් තරා; ඌරුකැනේ, සූකරසමූහයා; නේතමෙනේ, නේක

මෙසේ, සේනපරිද්දෙන්; කපටිකාවල්, වංචාසහිතවූ ප්‍රකාර යන්; ලූමෙන්, නැබූවාක්මෙන්; අවට, හාත්පස; ඊදෙමිනේ දුනුදෙමින්; බැඳි, බඳිනුලැබූවාවූ; පබරු, පබරුපයන්; දක, දශීනයකොට; වේවැල්දෙඩිමෙන්, එළුම් ග්‍රාම්‍යෙන්; එපිට, ඈත; නොසිනේයා, ඝෙනනාශයෙන් යව.

31 අවට සුනිල් බටලැහැබින් බැබ ලිය
එමන කොවුල් ලත් තැනතැන හැඩ ලිය
ලකල කමල් නිලුපුල් විල් විපු ලිය
මිතුරු කිරල් සඳ සිරිදකු බට ලිය

31 අවට, හාත්පස; බැබලීය, බබලනලද්දවූ; බටලැහැබින්, බටවනයෙන්ද; එමන, ඒමසනකයෙහි; තැනතැන, තන්හිතන්හි; හැඩලිය, හඬලනලද; කොවුල්ලත්, කොකිලයන්ගෙන්ද; කමල්නිලුපුල්, පද්ම හා නිලොත්පලයන් ගෙන්යුත්; විපුලිය, මහත්වූ; විල්, තටාකයෙන්ද; ලකල, අලඞකෘතවූ; බටලිය, එනම්ග්‍රාමයාගේ; සිරි, ශොභාව; මිතුරු, මිත්‍රවූ; කිරල්සඳ, කාරඬවොපතමය; දකු, දශීණය කර.

32 පස් සීලේ වත් අනුසස් නොදත් ද න
ගොස් දැලේ සිට ගැඹුරේ ගැලිගෙ ණ
ම ස් ආලේ විමෙත් නිති දූල් හෙල න
ප ස් යාලේ ඔයබල පෙරමග පෙණ න

32 පස්සීලේවත්, පංචසීලනිවත්; අනුසස්, ආනිශංසය; නොදත්, නොදත්තාවූ; දන, ජනයා; ගොස්, ගමනයකොට; දැලේසිට, උභයපාර්ශව යෙහි සිටිනාව; ගැඹුරේගැලිගෙණ, ගම්භීර (ජල) යෙහි නිමග්නව; මස්ආලේවිමෙන්, මාංසලොභ යෙන්; නිති, නිරන්තරයෙන්; දූල්, ජාලිකාවන්; හෙලන, දමන්නාවූ; පස්යාලේ, එනම්ග්‍රාමයෙහි; පෙරමග, පූර්වමාගී යෙහි; පෙණෙන, දෘශ්‍යමාන වන්නාවූ; ඔය, හ්‍රදය; බල, නිරීක්ෂණය කර.

33 මාව ත් අ ඹ නළල සිකිපිල් වරලසි නි
රූ ර ත් හැ ඹ දිලෙන මිණිබරණ විලසි නි
ර්මෙ ත් ඉ ඩ නොමැති සැදිසල් පිල්පෙළි නි
වේය ත් ගොඩ සොඳුරු මග පසුකරගොසි නි

33 අඹමාවත්, අම්බවත්‍රාකාරවූ; නළල, ලලාටයෙන්ද; සිකි පිල්. මයුර පිජ වැනි; වරලසිනි, කෙශකලාප යෙන්ද; මිණි බරණ, මාණික්‍යාභරණ යෙන්ද; දිලෙන, බබලන් නාවූ; රත්රූහැඹ, සවර්ණරූපාකාරවූ; විලසිනි, විලාසිනින් ර්මෙත්, අංගමනයකිර්මෙත්; ඉඩනොමැති, අවකාශනැත් නාවූ; සල්පිල්පෙළිනී, ආපණශාලා පඞ්ක්තීන්; සැදී, සජ් ජිතවූ; වේයන්ගොඩ, එනම්ග්‍රාමයෙහි; සොඳුරු, සුන්දරවූ මග, මාර්ගය; පසුකරගොසිනි, පසුකොටගොස්.

34 ලි ය ගො ල් ලේ සබඳව සිහිනා නොවිත ර
පැ හැ දු ල් ලේ නිල් දල පෙළිනි මනහ ර
තු රු පු ල් ලේ නත්වග විසිතුරු පත ර
හො රගො ල් ලේ වනමැද බැස වඩු මිතු ර

34 නොවිතර, අප්‍රමාණවූ; ලියගොල්ලේ, ලතාසමූහයා; සබඳව, සම්බන්ධව; සිහිනා, සිහිත්නාවූ; පැහැ, ප්‍රභාවන්; දුල්ලේ. උජ්ජ්වලිතවූ; නිල්, නීලවර්ණවූ; දලපෙළිනි, පත්‍ර පඞ්ක්තියෙන්; මනහර. මනොඥවූ; පුල්ලේ, ප්‍රුල්ලවූ; නත් වග, නොයෙක්වර්ගීනන්ගේ; පතර, මහත්වූ; තුරු, වෘක්ෂ යන්ගෙන්, විසිතුරු, විචිත්‍රවූ ; හොරගොල්ලේ, එනම්ග්‍රාම යෙහි; වනමැද, වනමධ්‍යයට; බැස, අවතීර්ණව; මිතුර, මිත්‍රය; වඩු, ප්‍රයාණය කර.

35 කුසුමෙන් දිලිතු රේ ය වන සි රේ ය
බිගු හැන්නදකෙ රේ ය සුමි හි රේ ය
ගව රුපු මුල සෙ රේ ය මහ තු රේ ය
දුටුවත් බිය කෙ රේ ය තිර ස රේ ය

35 කුසුමෙන්, පුෂ්පයෙන්; දිලි, උජ්ජ්වලිතවූ; තුරේය, වෘක්ෂයන්ඇති; වනසිරේය, (එම) වනමස්තක යෙහි; බිගු හැන්, භෘඞ්ගසමූහයා; සුමිහිරේය, ඉතාමිහිරිවූ; නද, නාද;

කෙරේය, කරයි; මඟතුරේය, මාර්ගාන්තරයෙහි; ගවරූපු මුල, වෘෂභ ශත්‍රු සමූහයා; දුටුවිත්, දක්ෂිණාකලවුත්; තිර සරේය, ස්ථිර සාරයෙන්; බිහෙකෙරේය, භය කර මින්; සෙරේය, සංචාරණයකෙරේ.

36 තිල්කටරොලු ම ලි ය    වැනි පි    ලි ය
විදහා සෙල් ත ලි ය    වෙත ව    ලි ය
තමත්මොනර ක ලි ය    සහ ති    ලි ය
රඟන මියුරු පෙ ලි ය    මත ක    ලි ය

36 තිල්කටරොලුමලිය වැනි, තිලකවරොලුමල් වැනිවූ; පිලිය, පිඡයත්; විදහා, විවෘතකොට; වලිය, වනයෙහි; සෙල්තලියෙවෙත, ශිලාතලයත් සමීපයෙහි; තමත්, තමත් ගේ; මොනරකලිය සහ; මයූරකාන්තාවන් සමඟ; තිලිය, සන්තුෂ්ටව; රඟන, නෘත්‍යකරන්නාවූ; මතකලිය, මනොඥවූ; මියුරුපෙලිය, මයුරසමූහයන්ද.

37 නව තඹ පලු රැ සා ය    ගස ග    සා ය
බුදිමින්තොලු ග සා ය    නොව ල    සා ය
හලහොල්මන් අ සා ය    මුර ග    සා ය
දුවන මුවන් කි සා ය    ලු දෙ    සා ය

37 ගසගසාය, ගවජයන්පාසා; නොවලසාය, වහා; තොලු ගසාය, මුවනඹා; නවතඹුපලු රැසාය, අභිනව තාම්‍ර පල්ලව සමූහයා; බුදිමින්, අනුභවකරමින්; හලහොල්මන්අසාය, හල හොල්මන් අසමින්; මුරගසාය, කෑගසා; කිසාය ලු දෙ සාය, කිස් ලුලුඅත; දුවත, ධාවනය කරන්නාවූ; මුවන්, මෘගයන්ද.

38 සුපිපි පියුමු පු    ලි ය    සැදිපි    ලි ය
කිඳමිනිවුරු හි    ලි ය    තොක මු    ලි ය
බොල්කෙලපෙණහැලි ය    බිම හැලි    ලි ය
වනඋෟරත් ර    ලි ය    සුවි පු    ලි ය

38 සුපිපි, සුපිෂ්පිතවූ; පියුම්, පද්මයා; උපුලිය, උත්පල යන්ගෙන්; සැදි, සජ්ජිතවූ; පිලිය, තමාකයන්ගේ; ඉවුරු,

තීරයන්; නෙක, බොහෝවූ; මූලීන, මූලාත්තෙරෙහි; කි ලිය, කොෂව; කිදිමින්, හක්නාකරමින්; හැලිය, බවලවූ; බොල්, ගහවූ; කෙලපෙණ, ඝනීකාඵෙණග; තිම, භූමි යෙහි; හැලිය, වඟුලාවූ; සුම්පුලිය, මහත්වූ; එන ඌරන් රළිය, වනසූකරසමූහ යන්ද.

39 පැන පැන අතු අ ගා ය නෙක ව ගා ය
කාපලතුරු සු ගා ය කර ද ගා ය
වට පිට මග ම ගා ය කර න ගා ය
යන වඳුරන් ර ගා ය මන ර ගා ය

39 අතුඅගාය, ශාඛාග්‍රයන්හි; පැනපැන, ප්‍රස්කන්ධනයකොට කොට; දගායකර, දඟකරමින්; නෙකවගාය, නොයෙක් වර්ගවල; තුරුසුගාය, වෘක්ෂසමූහයාගේ; පල, ඵලයන්; කා, අනුභවකොට; කරනගාය, ග්‍රීවයඹසවා; වටපිට, හාත්පස ඇතභාගයන්; මගමගාය, නිරීක්ෂණය කොට කොට; යන, යන්නාවූ; මනරගාය, මනොඥවූ; වඳුරන්, වානරයන්ගේ රගාය, ආකාරයද.

40 නොහැ, රම පවතින තර වෙර නි සා
උ ර, ණව උන්නුන් පසු නොමබැ සා
මි හි, පිට රිහිරෙන් තෙමු නොවල සා
පො ර, වැද තැනතැන සරණවිරු සා

40 නොහැරම, අත්නොහැරම; පවතින, පවතින්නාවූ; තර, මහත්වූ; වෙරනිසා, (ජාති) වෛරය කරණ කොට ගෙණ; උන්නුන්, අන්‍යෝන්‍යයන්; පසුනොමබැසා, පසුබට නොවී; තැනතැන, තන්තන්හි; නොවලසා, වගා; පොර වැද, යුද්ධප්‍රවිෂ්ටව; මිහිපිට, පෘථිවි මස්තකය; රිහිරෙන්, රුධිරයෙන්; තෙමු, තෙමුවාවූ; සරණවිරුසා, චරණ යුධ සමූහයෙන්ද.

41 අ ව, රට පත්වෙනතුරු දිනර දූ
එ ලි, බැස නෑවිත් සිත බියවැ දූ
එ ල් ලි ගෙණැ සිටි වනතුරු මැ දූ
න ම, පිඩු වැනි මහ වවුලන් රෙ දූ

41 දිනරදූ, සූර්‍ය්‍යයා; අවරට, අස්තපර්වතයට; පත්වෙන

තුරු, සම්ප්‍රාප්තවූයෙක්; සිත, චිත්තයෙහි; බිඳවැදූ, භග්න ප්‍රවිෂ්ටව; එලිබැස, ආලෝකාව තිබීව; නැවිත්, නොම ඇවිත්; වනතුරුමැදූ, වනවෘක්ෂමධ්‍යයෙහි; එල්ලීගෙණැසිටි, එල්බගෙණ සිටියාවූ; තම්පිඩුවැනි, අන්ධකාර පිණ්ඩයක්හා සමානවූ; මහවවුලන්රොදූ, මාවවුලන් සමූහයද.

42 ගිරවුන් අඹ නෙ ළා දෙරණ මහ ළා යා
දූසගව පල් පි ළා එනෙණ වු ළා යා
බූදිමින් පල ප ළා නිබඳ කෙ ළා යා
සිව්න රගද බ ළා එවන තු ළා යා

42 ගිරවුන්, කිර පක්ෂීන්විසින්; නෙළා, කඩා; දෙරණ, භූමියට; හෙළායා, හෙළනලද්දාවූ; අඹ, ආම්‍රඵලයන්; ගව පල් පිළායා, ගොපාල පොතකයන්; දූක, දර්ශනය කොට; ඒ, එම ඵලයන්; අවුලායා ගෙණ, අවුලා හැරගෙණ; පල පළා, කන්න කොට කොට; බූදිමින්, අනු භව කර මින්; එවන තුලායා, ඒ වනය ඇතු ලත නොහොත්; තුලායා, මහත්වූ; එවන, ඒ වනයෙහි; නිබඳ, නිරන්තර යෙන්; කෙළායා, ක්‍රීඩා කොට; සිව්නරගද, සිව්නු ලබන්නාවූ ආකාරයද; බලා, නිරීක්ෂණය කොට.

43 සෙද සෙද වනතුරු මත නොම දේ යා
වැ ද වැ ද මිනිමුතු මල්සුව දේ යා
ද ද න ද හැදගෙණ එන නිබ දේ යා
ම ද නල විදවිඳ යව සබ දේ යා

43 නොමදේයා, බොහෝවූ; වනතුරුමත, වනවෘක්ෂ මස්තකයෙහි; සෙදසෙද, වගවගා; වැදවැද, වැදිවැදී; මිනි මුතුමල්, ප්‍රබුද්ධකුසුමයන්ගේ; සුවදේයා, සුගන්ධයද; දදනද, පක්ෂිනාදයද; හැදගෙණ, ආකර්ෂණය කොට; නිබදේයා, නිරන්තරයෙන්; එන, එන්නාවූ; මදනල, මන්දමාරුත (ස්පර්ශ) විඳවිඳ, ලබලබා; සබදේයා, මිත්‍රය; යව, ප්‍රයාණයකර.

44 වනපි රි සේ කවුරුත් දුටුකල නෙති න
මිල ස රි සේ දිගෙණැ වෙළඳම් කර ණ
වනපි රි සේ ඔව්නා අනගිව දිළ න
තිය හ රි සේ කඩපෙළ පසුකර ගොසි න

44 නෙතින, නෙත්‍රයෙන්; දුටුකල, දුටුකල්හි; කවුරුත්,

සියල්ලෝම; පිරිවේවන, ප්‍රිහිටිත්නාවූ; සරිගේ, සමානවූ; මිලුගෙණ, මුදල්ගෙණ; දී, දෘඪයකොට; වෙළඳම්කරණ, වෙළඳම්කරන්නාවූ; අනගි, අනඝව; දිලෙන, බබලන්නාවූ; විපියා, අඟණ්වූ; වත, වස්තුන්ගෙන්; පිරි, පූර්ණවූ; හියහරිකුල්, එනම්ග්‍රාමයෙහි; කඩපෙළ, ආපණශාලාපඞ්ක්තිය; පසුකරගොසින, පසුකොටගොස්.

45 නිමල් වතින් බබලමිනා සඳතු ලිය
සුනිල් කෙසින් ගනලෙසිනා පැහැදි ලිය
ලකල් බඳුන් ඉදිකරණ සිවුමැ ලිය
කුඹල් කතුන් බලපෙණෙනා අකුර ලිය

45 සඳ තුලිය, චන්ද්‍රයාහා සමානවූ; නිමල්, නිර්මලවූ; වතින්, වක්ත්‍රයෙන්; බබලමිනා, දිලිසෙමින්; ගනලෙසිනා, මේඝකූටපරිච්ඡේදන්; පැහැදිලිය, පැහැදිලිවූ; සුනිල්, ඉතා නිල්වූ; කෙසින්, කේශකලාපයෙන්; ලකල්, අලඞ්කෘතවූ; බඳුන්, භාජනයන්; ඉදිකරණ, ඉදිකරන්නාවූ; අකුරලිය, එනම්ග්‍රාමයෙහි; පෙණෙනා, දෘශ්‍යමාන වන්නාවූ; සිවුමැලිය, සුකුමාරවූ; කුඹල්කතුන්, කුම්භකාර කාන්තාවන්; බල, නිරීක්ෂණය කර.

46 අසමින් සිතුපැහැද දුන මුනිපෙළදහම
පැවියන් පටන් දන්සිල් බවමින් බැරම
තිතියෙන් සරණ මහදන ගණ දුකදුකම
නොගොසින් අළුත්ගම වැද මමිතුරු උතුම

46 මුනි, සර්වඥයන්වහන්සේගේ; පෙළදහම, පාළිධර්මය; අසමින්, ශ්‍රවණයකරමින්; සිතුපැහැද, චිත්තප්‍රසාදව; පැවියන්පටන්, කුඩාවූන්ආදිකොට; බැරම, බොහෝසේ; දන්සිල්බවමින්, දානශීලභාවනාකරමින්; තිතියෙන්, නිරන්තරයෙන්; සරණ, සංවාරණයකරන්නාවූ; මහදනගණ, මහා ජනසමූහයා; දුකදුකම, දශිතාත කොට කොටම; මමිතුරු උතුම, මාගේමිත්‍රොත්තමය; නො, යුෂ්මත්හු; ගොසින්, ගමනයකොට; අළුත්ගම, එනම්පියසට; වැද, ප්‍රවිෂ්ටව.

47 උරපුරමින් ඇදහැරිහිර ගේශා
දියදහරින් ගෙණිඑන නොනව න්‍යා
පලපතරින් බබලන මනර ගේයා
සිරි තරඹන් අත්තනගලු ගගේනා

47 උරපුරමින්ඇද, ලයපුරාආකර්ෂණයකොට; හැරි, හරිණ ලද්දාවූ; හිරගේශා, ශර ආකාරවූ; දියදහරින්, ජලධාරා වෙන්; ගෙණඑන, ගෙණඑන්නාවූ; නොනවගේයා, නොයෙක්වගීවල; පලපතරින්, ඵලසමූහයෙන්; බබලන, භ්‍රාජිත වන්නාවූ; මනරගේයා, සිත්කළුවූ; අත්තනගලු ගගේනා, එනම්නදියෙහි; සිරි, සොභාව; තරඹන්, නිරීක්‍ෂණයකරන්.

48 නිමල එගඟ දියවර බැස නා නා
කොමල අඟන උඩුකුරුවිට පී නා
උදුල නුවන් නිලුපුල් මල් මූ නා
කමල සුපිරි තන හස බල පේණා

48 නිමල, නිර්මලවූ; එගඟ, ඒගඟාවෙහි; බැස, අව තීර්ණව; දියවරනානා, ජලස්නානය කරන්නාවූ; කොමල, කොමලවූ; අඟන, අඞ්ගනාවෝ; පීනා, පීනම්න්; උඩුකුරු විට, උඩුකුරුවූකල්හි; පේණ, දෘශ්‍යමානවන්නාවූ; උදුල, උජ්ජ්වලිතවූ; නුවන්, නේත්‍රනැමති; නිලුපුල්මල්, නීලොත් පලපුෂ්පද; මූනා, වක්ත්‍රනැමති; කමල, පද්මද; සුපිරි, සම්පූර්ණවූ; තන, පයොධරනැමති; හස, හංසයන්ද; බල, අව ලොකනය කර.

49 එකතුන් දෙනුවන් වත තන තනා
දකිමින් නිලුපුල් සරහස තදි නා
විලියෙන් නියතින් සරිනැති බැව් නා
එගගින් ගිනවැටි සැඟවෙන ලෙසි නා

49 එකතුන්, ඒකාන්තාවන්ගේ; දෙනුවන්, උභයනෙත්‍ර යන්ද; වත, වක්ත්‍රයන්ද; තනතා, හිනිමෙයන්නාවූ; තන, පයොධරයන්ද; දකිමින්, දර්ශනයකරමින්; නිලුපුල්, නිලොත් පලය; සර, පද්මය; හස, හංසයෝය යන මොවුහු; සරි නැතිබැව්නා, (තමන්) සමානනොවනහෙයින්; තදිනා, තර

යේ; පිළියෙන්, ලජ්ජාවෙන්; සැඟවෙනලෙසිනා, සැඟවෙන පරිද්දෙන්; එයගින්, ඒගංගාවෙන්; නියතින්, ඒකාන්ත යෙන්; ශ්‍රීවැනි, ශ්‍රීයාක්මෙනි.

50 තනත් තනා දිලි ගෝමර පත රේ
සොඳින් උලා සත හනකල එස රේ
සඳුන් සුවඳ කළ ගත කොකුමඟ රේ
තොමින් මදව පැහැවිය ගඟ දිය රේ

50 එසරේ, ඒකාන්තාවෝ; ගෝමරපතරේ, ගෝමරසඹුත යෙන්; දිලි, බබලන්නාවූ; තනත්, පයොධරයන්; තනා, කම්පාකරවා; සොඳින්, යහපත්ව; උලා, අතුල්ලා; සත හනකල, සනානයකරණකල්හි; ගත, ශරීරය; සුවඳකළ, සුගන්ධකලාවූ; සඳුන්, චන්දනයෙන්ද; කොකුමඟරේ, කුංකු මාඞ්ග රාග යෙන්ද; ගඟදියරේ, ගංගාජලය; තොමින්, බොහෝසෙයින්; මදවපැහැවිය, මාංජිෂ්ඨ වර්ණවූයේය.

51 ගැලෙමින් ගැඹුරෙහි නාන ල දේයා
දියරෙන් කඩමතු පැමිනි ස දේයා
දිලිරන් වැම්යුරු වටොර බි දේයා
කසමෙන් තුඹු දෙනි මින් නිබ දේයා

51 ගැඹුරෙහිනැලෙමින්, ගැඹුරේගිලෙමින්; නාන, ස්නා නයකරන්නාවූ; ලදේයා, ස්ත්‍රීන්ගේ; කඩ, වස්ත්‍රය; දිය රෙන්, ජලයකරණකොටගෙණ; මතුපැමිනිසදේයා, (ජල) මස්තකප්‍රාප්තවූකල්හි; දිලි, දීප්තිමත්වූ; රන්වැම්යුරු, ස්වර්ණ ස්වම්භාකාරවූ; වටොර, වෑතීරු; බිදේයාකනමෙන්, බිඳ කනපරිද්දෙන්; මින්, මත්ස්‍යයෝ; නිබදේයා, නිරන්තර යෙන්; තුඹුදෙනි, තුණ්ඩද්‍යනය කෙරෙත්.

52 එකල උතුම් ගන ලවන පෙ තේයා
නිමල දසන් කෙසරින් දිමු තේයා
ලකල උවන් පුල් කමල ර තේයා
සලෙල තුවන් බිඟුපෙළ කෙළි තේයා

52 උතුම්, උත්තමවූ; එකල, ඒකාන්තාවන්ගේ; ලවන, තොල්නැමති; පෙතේයා, පත්‍රයෙන්; ගන, ඝනවූ; නිමල, නිර්මලවූ; දසන්, දන්ත නැමති; කෙසරින්, කෙශරයෙන්;

දිමුතේය, දිප්තිමත්වූ; ලකල, අලඞ්කෘතවූ; උවිත්, වස්ත්‍ර නැමති; පුල්, ප්‍රඵුල්ලවූ; රතේයා කමල, රක්ත පද්ම යෙහි; සලෙල, සල්ලාලයන්ගේ; නුවන්, නෙත්‍රනැමති; බිඟුපෙල භෘඞ්ගසමූහයා; කෙළිතේය, ක්‍රීඩාකෙරෙත්‍ය.

53 මනනෙත් පිනමින් දුටුවන් සන සේ
කෙළිපත් උනුනු න් ඉඹිමින් පිය තේ
දුටුවොත් එකතු න් රුසිරෙන් දිමු තේ
බ ඹ ව ත් දුහැනි න් නොම්දෙයි නොසි තේ

53 දුටුවන්, දර්ශණය කල වූන්ගේ; මනනෙත්, මනෝ නෙත්‍රයන්; පිනමින්, පිනායය කරමින්; උනුනුන්, අනෙක නායකන්; අතේ, හස්තයෙන්; පිය, ජලය; ඉඹිමින්, සිංච නය කරමින්; කෙළිපත්, ක්‍රීඩාප්‍රාප්තවූ; රුසිරෙන්, රූපශ්‍රී යෙන්; දිමුතේ, දිප්තිමත්වූ; එකතුන්, ඒකාන්තවන්; දුටු වොත්, දර්ශණය කල හොත්; බඹවත්, බ්‍රහ්මයානුමුත්; දුහැ නින්, ධ්‍යාන යෙන්; නොම්දෙයි, නොම්දේයයි; නොසිතේ, චිතන නය නොවේ.

54 සලෙලැස සතන් මුව මුළු යා නොදිව ට
මදහස වහස රැහැණින් අදනා වෙන ට
සිහිලස නිමල් දියකෙළියෙන් යෙදි සි ට
සරතැස නිවා හැයි සඳ අඟනුන් ගොඩ ට

54 සලෙල, සල්ලාල යන්ගේ; ඇස, අක්ෂි නැමති දෝහෝ නොහොත්; සතන්, සන්තාන නැමති; මුවමුළු, මෘග සමූහයා; වට, හාත්පස; යානොදී, යාත්‍රාව නොකොට; මදහස, මන්දහාසය නැමති දෝහෝ නොහොත්; වහස, විභාස නැමති; රැහැණින්, කණ්ඩයන්; වෙතට, සමීපයට; අදනා, ආකර්ෂණය කරන්නාවූ; අඟනුන්, ස්ත්‍රීන්; සිහිලස, ශීතල ස්පර්ශ ඇත්තාවූ; නිමල්, නිර්මලවූ; දියකෙළි යෙන්, ජල ක්‍රීඩා වෙන්; යෙදිසිට, යුක්තව ඉඳ; සරතැස; ශ්‍රාන්තය; නිවා, නිර්වාපනය කොට; ගොඩට නැගී සඳ, ගොඩ නැංගාවූ කල්හි.

55 ලෑ ම ද දෙපියසුරු ගෝමර රැ සේ යා
බොල ද සුරත ලවනත දක ඇ සේ යා
නොම ද පිය තෙපුල් අසමින් නො සේ යා
ස බ ද පියෑද යාගත හැකි කෙ සේ යා

55 ලැමද, ලය මධ්‍යයෙහි හා; දෙපිය සුරු, පයොධරවයෙහි; ගෝමරරැසේයා, ගෝමරසමූහයද; බොලඳ, සුරතල්වූ; සුරත, සුරක්තවූ; ලවනත, තොල්ද; ඇසේයා, ඇසින්; දක, දශිණයකොට; නොමද, බොහෝවූ; පියතෙපුල්, ප්‍රිය වචන යන්; අසමින්, ශ්‍රවණය කර මින්; සබඳ, මිත්‍රය; කෙසේයා, කොහි පරිද්දෙන්; පියෑද, පයනාගා; යාගත හැකි, යාගත හැක් කේද.

56 සුණුක ම් කල සුනිමල් ඇවි රිලි දු ල ය
සල වැ ම් පිට නැඟු ඔපලූ දුව පෙ ල ය
මන ර ම් වන ගන උළු සෙවනැති ප ල ය
බල ව ම් පය සැදි විසිතුරු කුරු සැ ල ය

56 සුණුකම්කල, සුධාපරිකර්මය කළාවූ; සුනිමල්, ඉතා නිර්මලවූ; ඇවිරිලි, භිත්තියෙන්ද; සලවැම්පිට, ශෛලස්තම්භමස්තකයෙහි; නැඟු, නගනලද්දාවූ; ඔපලූ, ඔප්නැඟු; දුවපෙලය, දුවපඞ්ක්තියෙන්ද; දුලය, උජ්ජ්වලිතවූ; මනරම්වන, මනොඥ වන්නාවූ; ගන, ඝනවූ; උළු, ඉෂ්ටිකාමයවූ; පලය, ඡදනයන්ගේ; සෙවනැති, ඡායාඇත්තාවූ; වම්පස, වාමපාර්ශ්වයෙහි; සැදි, සජ්ජිතවූ; විසිතුරු, විචිත්‍රවූ; අකුරුසැලය, .අක්‍ෂරශාලාව; බල, නිරීක්‍ෂණයකර.

57 පෑ මි ත ල සුරගුරු සිරි සතරැ සි රු
සේ සේ රැස පැහැසර සොම් බරින් ස රු
ජේ පි . . සිත ඇදුරිඳු දුක සොඳු රු
තේ ආසිරි බස්දී සමු ගත් මිතු රු

57 සුරගුරුසිරි, බෘහස්පතිශ්‍රිය; මීතල, මහීතලයෙහි; පෑ, ප්‍රකාශකළාවූ; සතරැසිරු, ශාස්ත්‍රය ආශ්‍රයකළාවූ; පැහැසර, ප්‍රභාසාරවූ; සේරැසසේ, චන්ද්‍රයා පරිද්දෙන්; සොම්බරින්, සෞම්‍යභාරයෙන්; සරු, සාරවූ; සොඳුරු, සුන්දරවූ; ජේ

පි . . සිත, පේ පි . . සිංහනම්බු; ඇදුරිඳු, ආචාර්යෝත්තමයා දුසා, දණ්ශීයකොට; සේආශිර්බස්දී, බොහෝආශිර්වාදදෙම නකියා; මිතුරු, මිත්‍රය; සමුගස්, අවසර රැගස්.

58 සෙ ල් ල ම් කලෙත්දවල් ගෙදරදි තිති න
අ ල් ලෙත් එරිසියහබව් දූනගෙණ සොදි න
ලෙ ල් ල ම් කර කර දත්නන් ගෙන් අහ න.
කොල් ල න් පෙලක් වේ එහි සෝඩිය කිය න

58 දවල්, දිවාදවස; ගෙදරදී, ගෘහවාරයෙහිදී; තිතින, නිරන්තරයෙන්; සෙල්ලම්කලෙම්, ක්‍රීඩාකලතෙයින්; එරිසි, ඒසෙල්ලම්කලාවූරුවිය; අල්ලෙන්, හස්තලයෙන්; යනබව, යන්නාවූ භාවය; සොදින, ඥාපන්සේ; දූනගෙණ, ජානනයකොට; ලෙල්ලම් කර කර, ලෙල්ලම් කරමින්; දත්නන්ගෙන්, උගතුන්ගෙන්; අහන, විභාගකරන්නාවූ; සෝඩිය කියන, සෝඩියපාඩම් කරන්නාවූ; කොල්ලන්පෙලක්, කොලුවන්පඞක්තියක්; එහි, ඒඅක්‍ෂරශාලාවෙහි; වේ, වන්නේය.

59 ලි යා තිබෙන පොත්පත් ගණිමින් අයි ති
කි යා දුන් රගින් ඉඳ සමහරෙක් නි ති
බ යා දුකම් පාමින් හදතුල පැව ති
මෙයා කාර මොනවට සටහන් ලිය ති

59 සමහරෙක්, ඇතැම්කෙණෙක්; අයිති, (තමතමන්ට) අයිතිවූ; ලියාතිබෙන, ලියාතිබෙන්නාවූ; පොත්පත්, පුස්තකපත්‍රයන්; ගණිමින්, ග්‍රහණයකරමින්; කියාදුන් රගින්, කියාදුන්පරිද්දෙන්; ඉඳ, නිසද්‍යයකොට; නිති, නිරන්තර යෙන්; හදතුල, හෘදයාභ්‍යන්තර යෙහි; පැවති, ප්‍රවෘර්තිතවූ; බයාදුකම්පාමින්, භයපෙන්වමින්; මෙයාකාර, එම්පරිද්දෙන්; මොනවට, මනාකොට; සටහන්, (අක්‍ෂර)සණ්ඨානයන්; ලියති, ලෙඛනයකරත්.

60 උ ස ස් පෙළෙහි සැදූහැත්තන් එපම ණ ය
ප ර ස් නොකර ඉඳ සිතුනාතු කර ගෙ ණ ය
හ දි ස් සිව තවත් ඇතිකව යුතු ගැ ණ ය
තෙප ස් රැස ගණන් විමසති තැන තැ න ය

60 එපමණය, ඒප්‍රමාණයෙන් හෙවත් (තමත්) ඉගෙණ

ගත්නාවූ ප්‍රමාණයෙන්; උඇස්පෙළෙහි, උසස්පඞ්ක්ති යෙහි; සැදූ හැත් තන්, ශුභ විතාන යන්; සිතූ, චිත්‍රිතය; පරස් පෙසාකාර, නොවරදනා; සාතු සාර ගෙණය, අවසානකොට ගෙණ; ඉඳ, නිසද්‍යව; තවත්ඇති, වෙනත් විද්‍යමානවූ; කට යුතු ගැණිය, කර්තව්‍යයන්නිසා; හඳිය්සිව, ඉක්මන්ව; නෙපය්, ත්‍රිවිධ පංචම්යවූ; රැසගණන්, රාශිගණන්; තැන තැනය, තන්හිතන්හි; විමසති, පරීක්ෂාකරත්.

61 මු ලු කර කොවස් වැඩිඅඩු සැරණ අයු ර
සු ළු මහ අකල් විය පසුකරමින් ගැඹ ර
කො ලු වන් පෙලක් දසමින් නිදන නොවිත ර
පු ලු වන් පමණ තැත්කරගණිති නිරතු ර

61 කොටස්, කොට්ඨාසයන්; මුලුකර, සමූහයෝ සංකල්පනයකොට; වැඩි අඩුකරණ අයුර, ගුණ න්‍යායව්‍යවකලනය කරන් නාවූ පරිදිද; සුළුමහඅකල්, සුළුපොලිය මහපොලිය අකාල පොලිය යන පොලි ක්‍රමද; ගැඹර, ගම්භීරවූ; විය, විශය කිරීමද; පසුකරමින්, පශ්චාත් කරමින්; කොලුවන් පෙලක්, ලමයින් පඞ්ක්තියක්; නිදන, නිධාන ගණන්; නොවිතර, අප්‍රමාණවූ; දසමින්, දශම යන් ගෙන්; නිර තුරු, නිරන්තරයෙන්; ගණිති, ගණන්කරත්ය.

62 ගොවි කම් පිදි වියරණ සහ කිවි සගු ර
නි ය ති න් පරතෙර පත් නුවනැති පව ර
සි ති ය ම් ඇඳ ඇඳ තැනතැන ඉඳ නිත ර
සතො සි න් උගණිති සමහරු දෙස සත ර

62 ගොවිකම්, ගොවිකම්මාන්තය; වියරණවිදිසහ, ව්‍යාකරණ විධිනා; කිවිසයුර, කාව්‍යසාගරයාගේ; නියමින්, නියම යෙන්; පරතෙරපත්, පරතීරප්‍රාප්තවූ; නුවනැති, නුවනඇත් තාවූ; පවර, උතුම්වූ; සමහරු, ඇතම් අය; තැනතැන, තන්තන්හි; ඉඳ, නිසද්‍යව; නිතර, නිරන්තරයෙන්; සිති යම්ඇඳඇඳ, සිතියම්අඳිමින්; සතොසින්, සන්තෝෂයෙන් දෙසසතර, දෙශ (පෘථිවි) ශාස්ත්‍රය; උගනිති, උද්ග්‍රහණය කෙරෙත්.

63 මෙ ව න් අකුරුසැල දුටු මිතු රෙනි නොප ට
ග ම න් එපිට නොහැවනාබව මෙනෙහි කො ට
ගොසි න් මද නැනක් පෙණෙනා පෙර මග ට
සෙ මි න් ලංවෙමින් ගල්තොට තෙබ වෙත ට

63 මෙවන්, මෙවැනිවූ; අකුරුසැල, අක්ෂරශාලාව; දුටු, දර්ශනයකළාවූ; මිතුරෙනි, මිත්‍රයානෙනි; නොපව, යුෂ්මත්හට ගමන් එපිට නොවනාබව, ගමන් ඇතනොවන්නාවූ භාවය; මෙනෙහිකොට, සිතා; මදනැනක්, ස්වල්පඥානයක්; ගොසින්, ගමනය කොට; පෙරමගට, පූර්වපථයට; පෙණෙනා, දෘශ්‍යමානවන්නාවූ; ගල්තොටතෙබවෙතට, එනම් ක්ෂුද්‍ර නදී සමීපයට; සෙමින්ලංවෙමින්, සෙමින්ලඟාවී.

64 හ ඬ න අන් කිරල් විල් ලිහිණියන් මැ ද
න ව න තහද කිරලගනන් වෙත බොල ද
පැමි ණ සමගිවී සිතු පිරිසෙන් නොම ද
ප ම ණ බලා වලඳ නිසි ගොදුරු සො ද

64 හඬන, නාදපවත්නාවූ; අන්කිරල්, අන්‍යකාරණ්ඩව යන්හා; විල් ලිහිණියන් මැද, සාරිසා පක්ෂීන් මධ්‍යයෙහි; (සිටින්නාවූ) තහද, තාගේහෘදය; නවන, තාපනය කරන්නාවූ; බොලඳ, සුරතල්වූ; කිරලගනන්වෙත, කාරණ්ඩ වාංගනාවන්කරා; පැමිණ, සම්ප්‍රාප්තව; නොමද, බොහෝවූ; සිතුපිරියෙන්, චිත්තප්‍රීතියෙන්; සමගිවී, සාමාග්‍රීව; පමණ බලා, ප්‍රමාණයදැන; නිසි, යොග්‍යවූ; සොඳ, යහපත්වූ; ගොදුරු, ගොචරයන්; වලඳ, අනුභවකොට.

65 ලෙලෙන පවන වැද තඹවන් පලු පත ර
දි ලෙ න කුසුම් සුවඳින් කැඳවන බම ර
න රු ණ තුරෙක මුදුනත නැග කොල අත ර
ල ගි න මැනවි ගත සරතැස බැහැර ක ර

65 පවනවැද, සුලංවැදී; ලෙලෙන, ලෙලොපෙනවන්නාවූ තඹවන්, තාම්‍රවර්ණවූ; පලුපතර, පල්ලව සමූහයෙන්ද; සුවඳින්, සුගන්ධයෙන්; බමර, භෘංගයන්; කැඳවන, ආමන්ත්‍රණයකරන්නාවූ; කුසුම්, පුෂ්පයන්ගෙන්ද; දිලෙන, බබ

ලත්තාවූ; තරුණ, තරුණවූ; තුරෙක, වෘක්ෂයෙක්හි; මුදු
නත, මස්තකයට; නැග, ආරූඪව; ගත, ශරීරයෙහි; සර
නැස, ශ්‍රාන්තය; බැහැරකර, දුරුකොට; කොලඅතර, පත්‍රා
න්තරයෙහි; ලගිනමැනවි, නිවාසග්‍රහණය කරණු යහපති.

66 ද ව ල් දවස වෙහෙසින් තොප ගත කොම ල
නි ම ල් නෙත්යුවල පිරි නිදි ගැට විපු ල
කු රු ල් හඬ යකුල් පහරින් බිඳෙන ක ල
කි ර ල් දෙටුව නැගී සිට කරපිය සස ල

66 කිරල්දෙටුව, කාරණ්ඩජ්‍යෙෂ්ඨය; තොප, යුෂ්මත්හුගේ; කොමල, මෘදුවූ; ගත, ශරීරයෙහි; දවල්දවස, දිවාදිනයෙහි (පැමිණියාවූ) වෙහෙසින්, විහිංසනයෙන්; නිමල්, නිර්මලවූ; නෙත්යුවල, නෙත්‍රයුග්මයෙහි; පිරි, පූර්ණවූ; විපුල, මහත්වූ; නිදිගැට, නිද්‍රානැමති ග්‍රන්ථීන්; කුරුල්හඬ, පක්ෂිනාද නැමති; යකුල්පහරින්, යකුල්ප්‍රහාරයෙන්; බිඳෙනකල, භග්නවනකල්හි නැගීසිට, උත්ථිතවැ; පියසසලකර, පක්ෂචලනය කොට.

67 උ දා ගිරි කෙසර රිවිමත රැස් කෙස ර
වි දා පාත රඟ දක තම ගජ පත ර
මු දා ගෙණ තමන් දිවි දිවයන බැහැ ර
වි දා පියාපත් නුබ නැග වැඩමක ර

67 උදාගිරි, උදය පර්වත නැමති; කෙසර, සිංහ තෙමේ; රිවි, සූර්‍ය්‍යනැමති; මත, ශීර්ෂයෙහි; රැස්, රශ්මිනැමති; කෙසර, කේශරයන්; විදාපාතරඟ, විදහා පාත්තාවූ ආකාරය; දක, දශීණයකොට; පතර, මහත්වූ; තමගජ, අන්ධකාර නැමති හස්තියා; තමන්දිවි, තමන්ගේජීවිතය; මුදාගෙණ, ගලවාගෙණ; බැහැර, පිටත; දිවයන, දිවයනකල්හි; පියාපත්, පක්ෂ පත්‍රයන්; විදා, විදහා; නුබනැග, ආකාශා රූඪව; වැඩමකර, ප්‍රයාණයකර.

68 නි ත ර සුමන දෙව්රදසමග සුරග න
ප ත ර කුසුම් පරසතු පුදකර වඳි න
ස ත ර පා තඹර රැඳි සිරෙනි බබල න
එ ත ර සමන්ගිර බල පෙරදෙස පෙණෙ න

68 එතර, (තොපආකාශයටනැංගාවූ) ඒකාලයෙහි; සුර ගනසමග, දිව්‍යාඞ්ගනාවන්හාඑක්ව; සුමනදෙව්රද, සමන්

දිව්‍යරාජ්‍යාවිසින්; පරසතුකුසුම්පතර, පාරිජාතකුසුමසමූහය; පුදකර, පූජාකොට; වඳිනා, නමස්කාර කරණුලබන්නාවූ; සතර, ශාස්තෲන්වහන්සේගේ; පාතඹර, පාදපද්මය: රැඳි, රංජිතවූ; සිරෙනි, ශිඛරයෙන්; බබලන, භ්‍රාජ මාන වන්නාවූ; පෙරදෙස, පූර්වදිසාභාගයෙහි; පෙණෙන, දෘශ්‍යමාන වන්නාවූ; සමන්ගිර, සමනන්‍තකූටපර්වතය; බල, නිරීක්ෂණයකර.

69 සක් ව ල ගැබතුරේ ඇති සියලුම ඉසුරු රූ
එක් කළ තැනක රඟදුන්නොතිකි විසිතු රූ
යක් ව ල නම් මෙපියසෙහි පෙණෙනතොරතු රූ
සක් ව ල පුර තවර යා ගත් මිතු රූ

69 සක්වල ගැබතුරේ, චක්‍රවාට ගර්භ අභ්‍යන්තරයෙහි; ඇති, විද්‍යමානවූ; සියලුමඉසුරු, සකලෛශ්වර්‍ය්‍යයම; එක් කළතැනක, සමූහකළාවූස්ථානයක; රඟ, ආකාරය; දුන් නොතත්, දුන්නායකළේවීහම්; ඉනි, ඒකරණකොටගෙණ; විසි තුරු, විචිත්‍රවූ; යක්වලනම්, යක්වලනම්වූ; මෙපියසෙහි, මේ ග්‍රාමයෙහි; පෙණෙන, පෙණෙන්නාවූ; තොරතුරු, විශේෂ විභාගයන්; සක්වල, නෙත්‍රාන්හි; පුර, පූරණයකොට; තව ර, ගා; මිතුරු, මිත්‍රය; යාගත්, යාත්‍රාග්‍රහණයකරන්.

70 දු ල මිණිමුතු අබරණ සිරිගත් හැ ඩ ය
ප ළ කරකර කරමිනි සුළු අත් වැ ඩ ය
ඔ ළු මොල නොව විලසින් දතනෙත් මැ ඩ ය
හ ල වරගත ගණ බල හෙතරත්ගො ඩ ය

70 ගත්, ශරීරයෙහි; දුල, බබලන්නාවූ; මිණි මුතු අබරණ, මණිමුක්තාභරණයන්ගේ; හැඩය, ආකාරය; පළකර කර, ප්‍රකාශ කොට කොට හෙවත් පෙන්න පෙන්නා; සුළු අත්වැඩය, කුඩාහස්තකර්මාන්ත; කරමිනි, කරමින්; ඔළු මොලනොව, චණ්ඩප්‍රචණ්ඩනොවී; විලසින්, ලීලාවෙන්; දත, ජනයන්ගේ; නෙත්, නේත්‍රයන්; මැඩයහල, මර්දනයකළාවූ; හෙතරත්ගොඩය, එනම්ග්‍රාමයෙහි; වරගතගණ, උත්තම ස්ත්‍රීසමූහයා; බලා, නිරීක්ෂණයකර.

71 කෙ ස් පු ප් පා ගණිමින් ගෙවි දරුසුනි ල
උ ස් තෙ ප් පා නාරඟ දුවු කුරුලු කැ ල
ඇ ස් ත ප් පා ලූ වි කරලින් ලක ළ
කොස් රු ප් පා වෙලමැද වඩිනේ කිර ළ

71 ගෙවිදරු, ගොපිකාදාරකයන්; සුනිල, අතිනිලවූ;

කෙස්, කෙශයන්; පුප්පාගණිමින්,විදහාගණිමින්; උස්තෙප් පාතාරග, උසතෙබ්පෙන්වන්නාවු ආකාරය; දුටු, දශීණය කළාවූ; කුරුලුකැල, පක්‍ෂිසමූහයාගේ; ඇස්නප්පාලු, චක්‍ෂු නාපනයකළාවූ; විකරලින්, ශ්‍යාමජරින්ගෙන්; ලකල, අල ඞකෘතවූ; කොස්රුප්පාවෙලමැද, එනම් ක්‍ෂෙත්‍ර මධ්‍යයෙහි; කිරළ, කාරණ්ඩවය; වඩිතේ, ප්‍රයාණය කරන්නේයි.

72 මල් පැ නි යේ ලොල්කල බිඟු සුපුල්දු මා
බන් මි ණි යේ මගයන ගැල් පෙළෙනි ර මා
රැව් දි නි යේ අසමින් නොප සවන් න මා
ඇල් දෙනි යේ සිරිදුක යව නොවී ප මා

72 සුපුල්දුමා, සුත්ඵුල්ලවෘක්‍ෂයන්ගේ; මල්පැනියේ, පුෂ්ප මකරන්ද සෙරෙහි; ලොල්කල, ලොභකළාවූ; බිඟු, භෘඞග යන්ගෙන්ද; මග, මාර්ගයෙහි; යන, ගමනාකරන්නාවූ; ගැල් පෙළෙනි, ගැල්පඞක්තියෙහි; බන්, බඳනාලද; මිනියේ, කිංකිණිකයන්ගෙන්ද; දිනියේ, ජනිතවූ; රැව්, රාවය; නො ප, යුෂ්මත්හුගේ; සවන්, කණ්යන්; නමා, නමනකොට; අසමින්, ශ්‍රවණයකරමින්; ඇල්දෙනියේ, එනම්ග්‍රාමයෙහි;සිරි දුක, සොභාදශීණයකොට; පමානොවී, ප්‍රමාදනොව; යව ප්‍රයාණය කර.

73 වර ක් සි ටි ය ඉඩමෙහි යළි නොසිටය න
රැලක් සැ වි ය සමුදුර ගෙණ හැර පා න
හර ක් කැ වි ය ගනතිල් තණ හර බුදී න
පුව ක් වැ වි ය දකු මමිතුරු සඳ කල ණ

73 වරක්සිටිය, වනාවක්සිටියාවු; ඉඩමෙහි, ස්ථානයෙහි; යළි, නැවත; නොසිටයන, නොනැවතීයන්නාවූ; සමුදුර රැලක්සැවිය, සමුද්‍රතරඞගයක ආකාරය; හැරගෙණ, ග්‍රහ ණයකොට; පාන, ප්‍රකාශකරන්නාවූ; ගනතිල්, ඝනනිලවූ; තණඅහර, තෘණආහාර; බුදින, අනුභවකරන්නාවු; හරක් කැවිය, වෘෂභසමූහයා ඇත්තාවු; පුවක්වැවිය, එනම්ග්‍රාමය; කලණ, කල්‍යාණවූ; මමිතුරුසඳ, මාගේ මිත්‍රොත්තමය; දකු, දශීණය කර.

74 දූ ර එ ත  තදිත් වෙහෙසව පිග ගිනෙන්රි  දී
කඩ වෙ ත  නොසිඳ කාබි සැනසුමෙන් යෙ  දී
හැ ර ග ත  ගිඹන් සැතපෙන නොනගින් රැ  ඳී
ක ඩ ව ත  අම්බලම හඳිවෙයි පෙර මග  දී

74 දුර, දුරසිට; තදින්, සීඝ්‍රයෙන්; එත, එන්ම; පිපා, පාදය, රිදීගියෙන්, රුදුවුනෙයින්; කාබි, අනනපානය කොට; කඩවෙත, ආපණ ශාලා සමීප යෙහි; නොසිඳ, නිසිඳනය නොකොට; සැනසුමෙන්යෙදී, සැනසීමෙන් යුක්තව; ගත, ශරීරයෙහි; ගිම්හැර, ග්‍රීෂ්ම පහකොට; සැතපෙන, සන්තර්පනයවන්නාවූ; නොක, බොහෝවූ; මගින්රැඳී. මගින් ගෙන්රංජිතවූ; කඩවතඅම්බලම, එනම්විශ්‍රාමශාලාව; පෙර මගදී, පූර්වමාර්ගයෙහිදී; හඳිවෙයි, සම්මුඛවෙයි.

75 බේ ද  නොවී අනතුරු සබඳිනි පො  දු ව
යෝ ද  ලෙසින් පියබස් නෙපලා මු  දු ව
හා ද  වෙමින් උන්හැමවම එකබ  දු ව
තෝද  මදක් කල් එහි සැතපි ඉ  දු ව

75 අනතුරු, ඉක්බිති; සබඳිනි, මිත්‍රයානනි; බේදනොවී පාශ්වීගතනොව; පොදුව, සාධාරණව; යෝදලෙසින්, සමෂ්ටිපරිච්ඡෙදෙන්; මුදුව, මෘදුව; පියබස්, ප්‍රියවචනයන්; නෙපලා, තියා; උන්හැමටම, (විශ්‍රාමශාලාවෙහිසිටියාවූ) ඒසියල්ලටම; එකබදුව, එකසමානව; හාදවෙමින්, මිත්‍රවෙමින්; තෝද, යුෂ්මත්හුද; එහි, ඒ විශ්‍රාම ශාලාවෙහි; මදක්කල්, සවල්පකාලයක්; සැතපි ඉඳුව, සැතපී සිටුව.

76 සු නි ල්  නුවන් උඹුමුව තන අදර ර  තු
ප තු ල්  නොදිසි නැබවල සහ විසල් ප  තු
සි ය ල්  මියුරු පල වෙළඳුමෙකි නියු  තු
එ ක ල්  ලියන් දුක සිත බිඳනොගත යු  තු

76 එකල්, (නොපසැතපිසිටින්නාවූ) ඒකාලයෙහි; සුනිල් අතිනීලවූ; නුවන්, නෙත්‍රයන්ද; උඹුමුව, ඌර්ධ්වමුඛවූ; තන, පයොධරයන්ද; රතුඅදර, රක්තාධරයන්ද; පතුල්නොදිසි, අදෘශ්‍යමානපතුල්ඇති; නැබවලසහ, නාභිකවාටයසහ; විසල්, විසාලවූ; පතු, වක්ෂස්ථලයන්ද ඇත්තාවූ; සියල්මියුරුපල,

සකලදිග්විලයන්; වෙළඳනම්හි, වෙළඳවීතිරීමෙහි; නීලුතු, නිපුණවූ; ලයන්, සත්‍රින්; දැක, දර්ශනයකොට; සිත, චිත්ත යෙහි; බියනොනානතපුතු, භය නොහන පුස්තෝය.

77 පැහැදි සිහි න් නෙල් මල් පිනිදිය නොම ද
රැගෙණ අහි න් හැරසී සුදුවතින් සො ද
අතිස දහ ම් බවමින් මහ වතට වැ ද
ගලන මෙලසි න් මිහිපිට පැහැකිරි මුහු ද

77 පැහැදිසිතින්, ප්‍රසන්නචිත්තයෙන්; නොමද, බොහෝවූ නෙල්, නෙලද; මල්, පුෂ්පද; පිනිදිය, පිනිදියද; අහින්, හස්තයෙන්; රැගෙණ, හැරගෙණ සොඳ, මනාවූ; සුදුවතින් ශ්වෙතවස්ත්‍රයෙන්; හැරසී, සජ්ජිතව; අතිසදහම්, අතිශය ධර්මය; බවමින්, භාවනාකරමින්; කිරිමුහුද, ක්ෂීර සාගරයාගේ; පැන, ජලය; මිහිපිට, පෘථිවිමස්තකයෙහි; ගලනලෙසින්, ගලායන්නාක්මෙන්; මහවතට, මහාමාර්ගයට; වැද, ප්‍රවිෂ්ටව.

78 ද මා මරසෙනග පැමිණී බුදුබව ට
අ මා මහනිවන් දුන් මුනි පිදීම ට
ර මා පිරිස් දැකයන හා යන නැන ට
ප මා නොව නැගිටවඩු එතැනින් එපි ට

78 මරසෙනග, (දසබිම්බර) මාරසේනාව; දමා, දමනය කොට; බුදුබවට, බුද්ධත්වයට; පැමිණී, ප්‍රාප්තව; අමාමහ නිවන්, අමෘතමහානිර්වාණය; දුන්, (ලෝවැස්සාහටදෙ) දුන්නාවූ; මුනි, සර්වඥයන්වහන්සේ; පිදීමට, පූජාකිරීමපිණිස නායනානැනට, නොපයන්නාවූ ස්ථානයට; යන, යන්නාවූ; රමා, රම්‍යවූ; පිරිස්, පර්ෂද්; (සමූහයන්) දැක, දර්ශනයකොට පමානොව, ප්‍රමාදනොවී; නැගිට, උත්ථිතවැ; එතැනින්, ඒ ස්ථානයෙන්; එපිට, දුර; වඩු, ඇතුව

79 වෙරිගත් ම ඩ තැවරිය නැනතැනාහිගෙය න
රතු නෙත්දිඩ බැලුමෙන් නිරතුරු බල න
මැතඹිස්දෙ ඩ මින් කොළහල කරනදි න
කිරිබත්ගොඩ බල සහි බඹුරන් සර ණ

79 වෙරි, සුරාවෙරියෙන්; නැනනැන, තත්තිතන්හි; හිගෙන, හිමකරණකොටගෙණ; මඩනැවරිය, මඩනැවරුනාවූ;

ගත්, ශරීරද; නිරතුරු, නිරන්තරයෙන්; දිඹුලුමෙන්, දාඹුල්ලෙන්; බලන, නිරීක්ෂණය කරන්නාවූ; රතුනෙත්, රක්තනේත්‍රයන්ද ඇත්තාවූ; මැනවින් දෙබිඩින්, වාසිබෙස්ගියමින්; තදින, තරමේ; කොලු තලකර, කොලාහල කොට; කිරිබත්ගොඩ, එනම්ග්‍රාමයෙහි: සැරණ, සංචාරණය කරන් නාවූ; බඹුරන්, භ්‍රමරයන්; සහි, මිත්‍රය; බල, නිරීක්ෂණය කර.

80 නොම දි න් අඟුරු උදුනෙහි ලා පිඹ සෙමෙ න
ගිනි ය මි කරය පලුපළියර නෙකලෙසි න
ලොහොක මි කරණ ... නිරතුරු නොයෙකතැ න
ද කි මි න් දළගමින් සඳ එපිටයාගෙ ණ

80 නොමදින්, බොහෝ සෙයින්; අඟුරු, අඞ්ගාර; උදුනෙහිලා, ලිපෙහිදමා; පලු, යමුගුරු; ගිනියම්කර, උෂ්ණ කොට; නෙකලෙසින, නොයෙක්පරිද්දෙන්; පළිකර, වෙන් කොට; නිරතුරු, නිරන්තරයෙන්; නොයෙකතැන, බොහෝස්ථානයෙහි; ලොහොකම්කරණසැටි, ලොහකර්මකරන් නාවූ ආකාරය; දකිමින්, දර්ශනයකරමින්; දළගමින්, එනම් ග්‍රාමයෙන්; එපිටයාගෙණ, ඈතගොස්.

81 යු ග ත් ගිරු දියත උණුකර අළු කර ණ
පු ව ත් පල කරණුවස් රිවි දිනෙත් දි න
ම හ ත් අසුබලකුණෙව් ලොවට දක්ව න
සු ර ත් සඳ වලාපෙල බබලන ගුව න

81 යුගත්ගිරු, යුගාන්තසූර්‍ය්‍යයා; දියත, ලොකය; උණුකර උෂ්ණකොට; අළුකරණුවත්, භස්ම කරන්නාවූ ප්‍රවෘත්තිය; පලකරණුවස්, ප්‍රකාශකිරීමපිණිස; රිවි, සූර්‍ය්‍යතෙමේ; දිනෙත් දින, දවස්පතා; ලොවට, ලොකයාට; දක්වන, පෙන්වන් වන්නාවූ; මහත් අසුබලකුණෙව්, මහත් අශුබ නිමිති වැනි; සුරත්, අතිරක්තවූ; සඳවලාපෙල, සන්ධ්‍යාවලාහකපඞ්ක්තිය ගුවන, (අපර) ආකාශයෙහි; බබලන, බබලුයම.

82 දෙවෙනි න ම ට නොපැමිණි සිරිනිසුරුන ට
පෙවෙනි දුර ට පත් කිර්ඳුන් ස...ස්කො ට
බැති නි මොකට කළ වෙහෙරින් උදුලව ට
කැලණි පුර ට වදුනරුවන් මෙනෙහිකො ට

82 සිරින්, ඓශ්වර්‍ය්‍යයෙන්; ඉසුරුහට, ඊශ්වරයාහට

දෙවෙනිකමට, විතියභාවයට; නොපැමිණි, ප්‍රාප්තනුවූ; පෙවෙති, පාපයෙන්; දුරවපත්, දුරප්‍රාප්තවූ; නිරිඳුන්, (පූර්) නරෙන්ද්‍රයන්විසින්; මොකට, මොක්ෂයපිණිස; බැතිනි, භක්තියෙන්; කල, කරණලද්දවූ; වෙහෙරින්, විහාරයෙන්; වට, භාත්පස; උදුල, බබලන්නාවූ; කැලණිපුරට; කල්‍යාණිපුරයට; නෙරුවන්, ත්‍රිවිධරත්නය; මෙනෙහෙකොට, සිතාගෙණ; වදු, ප්‍රවිෂ්ට වෙව.

83 සරද ගුවන්තල හෙළිකල විලසබ ලී
විහිදි කැලුම්කඳ සිරි පෑ නෙතුරු පෙ ළී
නොමද පහන් පෙල මහවේ දෙපස දී ලී
පැලදි රුවන් හරවැනි ගෙලෙ පුරඹ ක ලී

83 සරද, සරත්කාලයෙහි; ගුවන්තල, ආකාශතලය; බලිවිලස, බලවත්ලෙසසින්; හෙළිකල, ආලෝක කලාවූ; කැලුම්කඳ, කාන්තිස්කන්ධය; විහිදි, විසතිර්ණවූ; නෙතුරුපෙළී නොයෙක්තාරකාසමූහයාගේ; සිරිපෑ, ශොභාපෙන්වූ; එහි, ඒනගරයෙහි; මහවේදෙපස, මහාවීථිදෙපාර්ශවයෙහි; දීලී, ජ්වලිතවූ; නොමද, බොහෝවූ; පහන්පෙළ, ප්‍රදීපපඞ්ක්තිය පුරඹ, නගර නැඹිති ස්ත්‍රියගේ; ගෙලෙ, ග්‍රීවයෙහි; පැළදී, බඳනාලද; කලී, මනොඥවූ; රුවන්හරවැනි, රත්නහාර යක්වැන්නේසි.

84 පවනින් තිහි ලෙලදෙන පුරඹර තු ලය
ගනරන් තුඟුයට අගබඳ දද පෙ ළය
මුනිඳුන් වැඳුමට චිත් සුරගන කැ ලය
නොගොසින් සිහිනෙව් දක පුර සිරි බ ලය.

84 පුරඹරතුලය, නගරආකාශ අභ්‍යන්තරයෙහි; පවනින්, මාරුතයෙන්; තිහි, නිරන්තරයෙන්; ලෙලදෙන, ලීලා පෙනවන්නාවූ; තුඟු, උස්වූ; ගනරන්, ඝනස්වර්ණමයවූ; යට අග, යෂ්ට්‍යග්‍රයෙහි; බඳ, බඳනාලද; දදපෙළය, ධවජපාලිය (කෙණ්ද) සුරගනකැලය, දිව්‍යස්ත්‍රීසමූහයා; මුනිඳුන් වැඳුමට, සර්වඥයන්වහන්සේ නමස්කාරපිණිස; චිත්, ඇවිත්; බලය, බලවත්වූ; පුරසිරි, නගරඓශ්වර්‍ය්‍යය; දක, දර්ශණයකොට; නොගොසින්, ගමනයනොකොට; සිහිනෙව්, ස්වප්නයක්මෙනි.

85 වර ල   නිල් සෙවෙල වතරත් තඹුරුක   න
උපු ල   බැම බමරවැල පිරි පුවල ත   න
දව ල   හස වටොර වර සරගත අත්   න
ලකල   ලිය තලත් එති පෙණෙය තැනතැ   න

85 වරල, කෙශකලාපනැමති; නිල්සෙවෙල, නීලශෛවාලයෙන්ද; වත, වක්ත්‍ර නැමති; රත්තඹුරු, රක්ත තාමරසයෙන්ද; නෙත, නෙත්‍ර නැමති; උපුල, උත්පල යෙන්ද; බැම, භෲනැමති; බමරවැල, භෘඞ්ගාවලියෙන්ද; පිරි, පූර්ණවූ; පුවලතන, යුග්මපයොධරනැමති; දවලහස, ශ්වෙතහංසයන් ගෙන්ද; වටොර, වෘත්තෝරු නැමති; වර, උතුම්වූ; සරගත අතින, ඇත්සොඬින්ද; ලකල, අලඞ්කෘතවූ; ලිය, ස්ත්‍රීන් නැමති; තලත්, තථාකාරයන්; එති, ඒනාගරයෙහි; තැනතැන, තත්තිතන්හි; පෙණෙය, දෘශ්‍යමානවේ.

86 දුක ද න   යුගත තිරුගෙන්වන සමුදුර   ට
එසු ම න   ගිරි රජහු මිණිමෙවුලා වෙත   ට
සත හි න   යවන මහබල සෙනගක් ලෙස   ට
බැස ය න   කැලණිගඟසකි පෙණෙතොපනෙතට

86 යුගතතිරුගෙන්, යුගාන්තසූර්‍ය්‍යයාගෙන්; සමුදුරට, සමුද්‍රයට; වන, වන්නාවූ; දුකදන, දුඃඛජනනයකොට; එසුමන ගිරිරජහු, ඒ සමන්තකූට පර්‍වතරාජයා විසින්; මිණි මෙවුලා වෙතට, මණිමෙඛලාවක් කරා; සතහින, නිරන්තර යෙන්; යවන, යවනුලබන්නාවූ; මහබලසෙනගක් ලෙසට, මහත් භටසේනාවක්පරිද්දෙන්; බැසයන, බැසයන්නාවූ; කැලණි ගඟ, එනම්නදිය; සකි, මිත්‍රය; තොපනෙතට, තොපගේ නෙත්‍රයට; පෙණේ, දෘශ්‍යමානවේ.

87 ඇ දු රු   අවරනල සඳැවෙල පෙති පත   ර
රු දු රු   කිරණ කෙසරින් ගැවසුනු පව   ර
ගැ ඹු රු   නුබ විලෙහි දිනකර සුපුල් ස   ර
අ දූ රු   දියගලං යටවෙත එකපැහැ   ර

87 අවරඇදුරු, අපරපර්‍වත නැමති; නල, නාලයෙන්ද; සඳැවෙල, සන්ධ්‍යාවලාහක නැමති; පෙතිපතර, පෙතිසමූහයෙන්ද යුක්තවූ; රුදු, රෞද්‍රවූ; කිරණ, රශ්මි නැමති; පවර,

උදාම්වූ; කෙසරන්, කෙශරයෙන්; ගැවසුනු, ගහනවූ; ගැඹුරු, ගම්භීරවූ; නුබවිලෙනි, ආකාශ නැමති තටාක යෙහි; දිනකර, සූර්ය්‍යයා නැමති; සුපුල්හර, සුප්‍රඵුල්ල පද්මය; අඳුරු, අන්ධකාරනැමති: දිය, ජලය; ගලා, නිෂ්ගතව; එකපැහැර, එකහෙලා; පටවෙත, වැසීයනම.

88 පෙර ගිරගින් නැගිසඳ සඳකතගෙතු ල
දුක අග නුන් වත පිපි පියුමැසී නිම ල
සැක කරමින් බිඳිතට සෙද නෙලුඹු මු ල
බට විල සි න් දිසිවිය පිළිබිඹු ලක ල

88 පෙරගිරයින්, උදය පර්වත මස්තකයෙන්; නැගි, උද්ගතවූ: සඳ, චන්ද්‍රයා; සඳකතගෙතුල, චන්ද්‍රකාන්තපාෂාණයෙන්නිර්මිත ගෘහාභ්‍යන්තර යෙහි; අගනුන්, ස්ත්‍රීන්ගේ; වත, වක්ත්‍රය; දුක, දර්ශණයකොට; නිමල, නිර්මලවූ; පිපිපියුමැසී, ප්‍රඵුල්ල පද්මයකැසී; සැක කරමින්, ශංකා කරමින්; සෙද, එහා; නෙලුඹුමුල, පද්මමූලයන්; බිඳිතට, භග්න නිර්ම පිණ්ඩ: බටවිලසින්, බැස්සාවූවිලාශයෙන්; ලකල, අලඞ්කෘතවූ; පිළිපිඹු, ප්‍රතිබිම්බය; දිසිවිය, දෘශ්‍යමානවූයේය.

89 ද හ මි හිමි පුදට නිති එන නොක සන ට
ද හ මි කතිකයන් කැඳවා නිස්ලෙස ට
ද හ මි දෙසුවමැසි කල ලැදියන් පින ට
ද හ මි සැල බලා මිතුරිඳු වෙමින් තු ට

89 දහම්හිමි, ධර්මස්වාමින්; පුදට, පූජාකිරීමපිණිස; නිති, නිරන්තරයෙන්; එන, ආගමණයකරන්නාවූ; නොක, බොහෝවූ; සනට, සත්වයාට; දහම්කතිකයන්, ධර්මකථිකයන් කැඳවා, ආමන්ත්‍රණයකොට; නිසිලෙසට, යොග්‍යවූ පරිද්දෙන්; දහම්දෙසවමැසී, ධර්මදේශනාකරවම්හයි; පිනටලැදියන්, පින් කැමැත්තාවුන් විසින්; කල, කරණලද්දාවූ; දහම් සැල, ධර්මශාලාව; බලා, නිරීක්ෂණයකොට; මිතුරිඳු, මිත්‍රානාමය; තුටවෙමින්, සන්තොෂව.

90 පෙලෙන ලකල් අඹ දඹ තුරු හි සේ යා
ර ද න එපුර වෙපස දද රැ සේ යා
නු ව න න යොමුකර දුක සිතු ලෙ සේ යා
පැ මි ණ වෙහෙර ඇතුලට නොවල සේ යා

90 එපුර, ඒනගරයෙහි; වෙපස, වීථිපාශ්වීයෙහි; පෙලෙන එලයන ගෙන්; ලකල්, අලඞ්කෘතවූ; අඹ, ආම්‍ර; දඹ, ජම්

බූයයන; තුරුහිසේයා, වෘක්ෂවිශේෂයකයෙහි; රඳන, රජමානවූ; දදරැසේයා ධවජසමූහයන්ද තොරණ පංති සමූහයත්; න, නාගේ; තුවන, නෙත්‍රය; සොබ්බකර, අභිමුඛකොට; සිතුලෙසේයා, සිත්වූපරිද්දෙන්; දක, දර්ශනය කොට; වෙහෙරඇතුලට, විහාරාභ්‍යන්තරයට; නොවලසේයා, අනාලස්‍යව; පැමිණ, සම්ප්‍රාප්තව.

91 සුද ග ට  පත් මරු එක නෙපලින් පැර  දූ
පල කොට  සදහම් නිවණට හසර සැ  දූ
ගරු කොට  සියැසින් දුටුමෙන් අප මුනි  ඳු
බු දු ගෙ ට  වැදවැද ඔත් මහ පිළිම ව  ඳු

91 සුදගටපත්, සුඛප්‍රාප්තවූ; මරු, මාරයා; එකනෙපලින්, එකමවචනයෙන්; පැරදූ, පරාජයකලාවූ; සදහම්, සද්ධර්මය; පලකොට, ප්‍රකාශකොට; නිවණට, නිර්වාණයට; හසරසැදූ මාර්ගයසැරසූ; අපමුනිඳු, අපගේ සර්වඥයන් වහන්සේ; සියැසින්, ස්වකීයචක්ෂුසින්; දුටුමෙන්, දුටුවාක්මෙන්; ගරුකොට ගෞරවකොට; බුදුගෙටවැද, ප්‍රතිමාගෘහයට ප්‍රවිෂ්ටව; වැදඔත්, ශයනප්‍රාප්තාවූ; මහ පිළිම, මහා ප්‍රතිමා ස්වාමීන් වහන්සේ; වඳු, නමස්කාර කර.

92 පිළි ග ත්  මුනිඳු මිණිඇසි නයිඳුගෙ යැදු  ම
බැස වි ත්  නුබින් වැඩහිඳැ මිණිපලඟ ර  ම
බල ව ත්  දහම් දෙසුතැන කල තිසිලෙස  ම
දහ ගැ බි  හිමින් වඳු සිහිකර මුනිගුණ  ම

92 මිණිඇසි නයිඳුගෙ, මණි අක්ෂික නම් නාගරාජයාගේ; යැදුම, යාච්ඤාව; පිළිගත්, ප්‍රතිග්‍රහණය කලාවූ; මුනිඳු, සර්වඥයන් වහන්සේ; නුබින්, ආකාශයෙන්; බැසවිත්, බැස ඇවිත්; රම, රම්‍යවූ; මිණිපලඟ, මණිපල්ලඞ්කයෙහි; වැඩහිඳ, උපවේශනප්‍රාප්තව; බලවත්, මහත්වූ; දහම්දෙසුතැන ධර්මදේශනාකලාවූ ස්ථානයෙහි; තිසිලෙසම, යෝග්‍යවූපරිද්දෙන්ම; කල, කරණලද්දාවූ; දහගැබිහිමින්, ධාතුගර්භස්වාමීන්වහන්සේ; මුනිගුණම, සර්වඥගුණයම; සිහිකර, සමෘති මත්කොට; වඳු, නමස්කාර කර.

සකලවිධුරඵලයන්; වෙළඳාම්හි, වෙළඳාම්කිරීමෙහි; නිපුණු, නිපුණවූ; ලියන්, ස්ත්‍රීන්; දක, දර්ශනයකොට; සිත, චිත්ත යෙහි; බිඳනොවනතපුතු, භය නොගත ප්‍රයුක්තයෙහ.

77 පැහැදි සිහි ත් තෙල් මල් පිනිදිය නොම ද
රැගෙණ අති න් හැරසී සුදුවතින් සො ද
අනිස දහ ම් බවමින් මහ වතට වැ ද
ගලන ලෙසි න් මිහිපිට පැහැකිරි මුහු ද

77 පැහැදිසිතින්, ප්‍රසන්නචිත්තයෙන්; නොමද,බොහෝවූ තෙල්, තෛලද; මල්, පුෂ්පද; පිනිදිය, පිනිදියද; අතින්, හස්තයෙන්; රැගෙණ, හැරගෙණ සොඳ, මනාවූ; සුදුවතින් ශ්වේතවස්ත්‍රයෙන්; හැරසී, සජ්ජිතව; අනිසදහම්, අනිත්‍ය ධර්මය; බවමින්, භාවනාකරමින්; කිරිමුහුද, ක්ෂීර සාගරයාගේ; පැන, ජලය; මිහිපිට, පෘථිවීතලයෙහි; ගලනලෙසින්,ගලායන්නාක්මෙන්; මහවතට,මහාමාර්ගයට;වැද,ප්‍රවිෂ්ටව.

78 ද මා මරසෙනග පැමිණි බුදුබව ට
අ මා මහනිවන් දුන් මුනි පිදීම ට
ර මා පිරිස් දකයන නා යන තැන ට
ප මා නොව නැගිටවඩු එතැනින් එපි ට

78 මරසෙනග, (දසබිම්බර) මාරසේනාව; දමා, දමනය කොට; බුදුබවට, බුද්ධත්වයට; පැමිණි, ප්‍රාප්තවූ; අමාමහ නිවන්, අමෘතමහානිර්වාණය; දුන්, (ලෝවැස්සන්ට දෙනලද) දුන්නාවූ; මුනි, සර්වඥයන්වහන්සේ; පිදීමට, පූජාකිරීමපිණිස නායනතැනට, නොපයන්නාවූ ස්ථානයට; යන, යන්නාවූ; රමා, රම්‍යවූ; පිරිස්, පර්ෂද්; (සමූහයන්) දක, දර්ශනයකොට පමානොව, ප්‍රමාදනොවී; නැගිට, උපදිනවැ; එතැනින්, ඒ ස්ථානයෙන්; එපිට, දුර; වඩු, ඇතයම

79 වෙරිගත් ම ඩ තැවරිය තැනතැනහිමෙය න
රතු නෙත්දිඩ බැලුමෙන් තිරතුරු බල න
මැතඹිස්දෙ ඩ මින් කොළහල කරතදි න
කිරිබත්ගොඩ බල සකි බඹුරත් සර ණ

79 වෙරි, සුරාවෙරියෙන්; තැනතැන, තන්හිතන්හි; හි අගනා, හිමකරණකොටගෙණ; මඩතැවරිය, මඩතැවරූනාවූ;

ගත්, ශරීරද; නිරතුරු, නිරන්තරයෙන්; දිඹුලුමෙන්, දෘඪබැල්මෙන්; බලනා, නිරීක්ෂණකරන්නාවූ; රතුනෙත්, රක්තනෙත්‍රයන්ද ඇත්තාවූ; මැනවින්දෙඩමින්, චාටුබස්කියා මින්; නදින, නාදයේ; කොලු හලකර, කෝලාහල කොට; කිරිබත්ගොඩ, එනම්ග්‍රාමයෙහි; සරණ, සංචාරණයකරන් නාවූ; බඹුරන්, සුරඹුහිමියන්; සති, චිත්‍රය; බල, නිරීක්ෂණයකර.

80 නොම දි ත් අඟුරු උදුනෙහි ලා පිඹ සෙමෙ න
ගිනි ය ම් කරය පලුපළියර නෙකලෙසි න
ලොහොක ම් කරණ නිරතුරු නොයෙකතැන
ද කි මි ත් දළිගමින් සඳ එපිටයාගෙ ණ

80 නොමදින්, බොහෝ සෙයින්; අඟුරු, අඞ්ගාර; උදු නෙහිලා, ලිපෙහිදමා; පලු, යමුතුරු; ගිනියම්කර, උෂ්ණ කොට; නෙකලෙසින, නොයෙක්පරිද්දෙන්; පළිකර, වෙන් කොට; නිරතුරු, නිරන්තරයෙන්; නොයෙකතැන, බො හෝස්ථානයෙහි; ලොහොකම්කරණසැටි, ලොහකර්මකරන් නාවූ ආකාරය; දකිමින්, දර්ශනයකරමින්; දළිගමින්, එනම් ග්‍රාමයෙන්; එපිටයාගෙණ, ඈතගොස්.

81 යු ග ත් හිරු දියත උණුකර අළු කර ණ
පු ව ත් පල කරණුවස් රිවි දිනෙන් දි න
ම හ ත් අසුබලකුණෙව් ලොවට දක්ව න
සු ර ත් සඳ වලාපෙල බබලන නුව න

81 යුගත්හිරු, යුගාන්තසූර්යයා; දියත, ලොකය; උණුකර උෂ්ණකොට; අළුකරණුවත්, භස්ම කරන්නාවූ ප්‍රවෘත්තිය; පලකරණුවස්, ප්‍රකාශකිරීමපිණිස; රිවි, සූර්යයාතෙමේ; දිනෙන් දින, දවස්පතා; ලොවට, ලොකයාට; දක්වන, පෙන්වන් වන්නාවූ; මහත් අසුබලකුණෙව්, මහත් අසුබ නිමිති වැනි; සුරත්, අතිරක්තවූ; සඳවලාපෙල, සන්ධ්‍යාවලාහකපඞ්ක්තිය නුවන, (අපර) ආකාශයෙහි; බබලන, බබලන්නේම.

82 දෙවෙනි කම ට නොපැමිණි සිරිනිසුරුහ ට
පෙවෙනි දුර ට පත් නිර්ඳුන් ස[illegible]ස්කො ම
බැති නි මොකම කළ මෙහෙරින් උදුලම ට
කැලණි පුර ට වදුනෙරුවන්මෙනෙහිකො ට

82 සිරින්, ඓශ්වර්යයෙන්; ඉසුරුහට, ඊශ්වරයාහට

98 නම කර   උදිත තාරගණ පියනම අස   ල
නොවිතර   සැප සිලිල් රුපු අරණම පත   ල
බිය කර   සෙනකඳන් දෙනදල ගිර උදු   ල
සුර වර   බැමයුවල දෙව් සිරි දුරි නිස   ල

98 නමකර, නමස්කාරකොට; උදිත, ආවිෂ්කෘතකරන්නාවූ අසල, ආසන්නවූ; පියනම, ක්ෂේත්‍රයම්; නොවිතර, අප්‍රමාණවූ; සැපසිලිල්, සම්පත්ති නැමති ජලයද; පතල, මහත්වූ; රුපුඅරණම, ශත්‍රු නැමති අරණ්‍යයට; බියකර, භයංකරවූ; සෙනකඳන්, සේනාසමූහයන්ද; දෙන, දහනයකරන්නාවූ; දලගිර, ලලාටනැමති පර්වතයෙහි; උදුල, බබලන්නාවූ; සුරවර බැමයුවල, සුරේන්ද්‍රයාගේ භෘ යුග්මය; නිසල නිශ්චලවූ; දෙව්සිරිදුරි, මෙසතුටසොභාව ඉසිලී.

99 කල්   නොගොසින්ම විරිදුත්වෙතැ මුළුනොව   න
කල්   ලංකරණ හිමිනෙහ් කැලුමත් විඳෙ   න
දුල්   වන අඳුන් ගිරිකුල මුදුනෙහි පෙණෙ   න
නිල්   මිණිපහන් යුවලෙක් ඇතහොත් එමෙ   න

99 මුළුනොවන, කොණප්‍රවෙශ නොවන්නාවූ; විරිදුත් වෙතැ, වෛරීන්කරා; කල්නොගොසින්ම; කාලාතික්‍රමණය නොවම; කල්, කාලය හෙවත් මාරයා; ලංකරණ, ලඟා කරන්නාවූ; හිමි, (දෙව) ස්වාමිහුගේ; කැලුමත්, කාන්තින් විඳෙන, විකාශවන්නාවූ; නෙත්, නෙත්‍ර (යුග්මය) අඳුන්ගිරි කුලමුදුනෙහි, අජනකූටපර්වතමස්තකයෙහි; පෙණෙන, දෘශ්‍ය මානවන්නාවූ; දුල්වන, උජ්ජ්වලිත වන්නාවූ; නිල්මිණි පහන් යුවලෙක්, නීලමාණික්‍යප්‍රදීපයුග්මයෙක්; ඇතහොත් විද්‍යමානවූයේනම්; එමෙන, එආකාරය.

100 ගුව නේ   සරද දදමෙන් දිලෙන නොවිත   ර
බර ණේ   මිණි ලකල හිමි ගහණට පත   ර
හර ණේ   නුබැවින් විලිමෙයන් මෙන් නිත   ර
වදි නේ   වැනිය රණකුසනා කණ අත   ර

100 සරදගුවනේ, ශරත්ආකාශයෙහි; දදමෙන්, තාරකා පරිද්දෙන්; දිලෙන, බබලන්නාවූ; නොවිතර, අප්‍රමාණවූ; මිණිබරණේ; මාණික්‍යාභරණයෙන්; ලකල, අලංකෘතවූ;

හිමි, (ශ්‍රීදේවි සවාමිනුගේ; පතර, මහත්වූ; ගුණ(?)ට. ප්‍රාණ යට; හරණේත්‍රුවැටින්, සමානතුෂ්ණයින්; රණ්‍රූප, සවර්ණ ඕ ක්‍රූයය; විලිඹාස්මෙන්, ලජ්ජාවෙන් සෙයින්. නිතර, නිරන් තරයෙන්; නාකණ්ඨතා, ශයනිකණ්ඨාගාරයෙහි; වද්දනේ වැතිය, ප්‍රවිෂ්ටවන්නාය්මෙනි.

101 වි කු මෙ න් පතළ සුරසෙත්කල ඒසුර වි රූ
දු වූ වි න් සිත ලවන රනදරට විසිතු රූ
වි දු ලෙ න් උදුල සඳැවෙල යුවලක් සොඳු රූ
කෙලෙසින් නොබා සරියසි පවසති කවු රූ

101 පතළ, පතළාවූ; විකුමෙන්, වික්‍රමයෙන්; සුරසෙත් කල, දිව්‍යශාන්තිකලාවූ; ඒසුරවිරූ, ඒසුරවිරයාගේ; දුවුවන්, දශීණකලවූත්ගේ; සිත්අලවන, චිත්තාලයවන්නාවූ විසිතුරු, විචිත්‍රවූ; රනදරට, රත්නාබරයට; විදුලෙන්, විද්‍යුල් ලතාවෙන්; උදුල, ජ්වලිතවූ; සොඳුරු, සුන්දරවූ; සඳැවෙල යුවලක්, සන්ධ්‍යාවලාහක යුග්මයක්; සරියසි, සමානයයි; කවුරු, කිනම් කෙනෙක්; නොබා, භාෂණයාව; කෙලෙසින්, කවරපරිද්දෙකින්; පවසති, ප්‍රකාශකරද්ද.

102 අ වු රණ තමවලලු රැස් මල්කැනහියෙ නි
වෙවු ලත රතු ඇඟිල් නවතඹ පලු ගියි නි
ලෙවි හට කැමති සිරිදෙන සිහිකරත පෙ ණි
සි වි කර එහිමි දෙව්තුරු අතුසිරින් දි නි

102 තම, අන්ධකාරය; අවුරණ, ආවරණය කරන්නාවූ; වලලුරැස්, නූපුරරශ්මිනැමති; මල්කැනහියෙනි, පුෂ්පස්තවක යෙන්ද; වෙවුලත, (දැත නැමති සුලගින්) චංචලවන්නාවූ; රතුඇඟිලි, රක්තාඞ්ගුලි නැමති; නවතඹපලු, අභිනව තාම්‍ර පල්ලව යෙන්ද; ගියිනි, ගහනවූ; සිහිකරත, සමෘද්ධිමත් කරන්නම; පෙණි, දෘශ්‍යමානව; ලෙව්හට, ලෝකයාහට; කැමතිසිරි, අභිමතඓශ්වර්‍ය්‍ය; දෙන, දානයකරන්නාවූ එහිමි, එස්වාමියාගේ; සිව්කර, චතුර්හස්තය; දෙව්තුරුඅතු සිරින්, දිව්‍යවෘක්ෂ ශාඛාශ්‍රියෙන්; දිනි, ජයගති.

103 ම ල් අව්පෙර දිනූ තුනුරුසිරෙහි නිත ර
ග ල් වන නෙත් කැලුම්කඳ සුරගනන් ව ර
ඇ ල් මෙන් කෙළින සිරිලිය පැමිණ ඇමව ර
නි ල් මිණි තලෙක සිරිලදි හිමි පලල් උ ර

103 පෙරමල්අව්, පූර්වඅනධ්‍යාය; දිනූ, ජයගත්තාවූ; තුනු

රූසිරෙහි, ශරීරශ්‍රීයෙහි; නිතර, නිරන්තරයෙන්; වර, උතුම්වූ සුරඟනන්, දිව්‍යාඞ්ගනාවන්ගේ; නොක්කැලුම්සඳ, නොනූ කාන්තිසකන්ධය; ගල්වන, ආලේපකරවන්නාවූ; හිමි, (දෙව) ස්වාමීහුගේ; පලල්උර, පෘථුලවූ වක්‍ෂඃස්ථලය; සිරිලිය, ශ්‍රී කාන්තාව; පැමිණ, ප්‍රාප්තව; ඇමවර, සදා කාල යෙහි; ඇල්මෙන්, ආශාවෙන්; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; නිල් මිණිතලෙක, නීල මාණික්‍ය ශිලා තල යෙක්හි; සිරිලදි, ශෝභා ලද්දේය.

104 පැහැසරූ   අනගි නවමිණි මෙවුලෙහි පත   ර
පිවිතු රූ   සිහිල් සිලිලෙන් තෙමෙන ඇමව   ර
පියක රූ   පුලුලු තුලබිම සුසැදි පුවත   ර
රඹ තු රූ   සිරිය කිය ලිය හිමි සඳ වතො   ර

104 පැහැසරූ, ප්‍රභාසාරවූ; අනගි, අනඝවූ; නවමිණි මෙවුලෙහි, අභිනවමාණික්‍යමේඛලාදාමයෙහි; පතර, රැශ්මිනැමති; පිවිතුරූ, පවිත්‍රවූ; සිහිල්සිලිලෙන්, සීතලජලයෙන් ඇමවර, සැමකල්හි; තෙමෙන, තෙමෙන්නාවූ; හිමිසඳ වතොර, ස්වාමී උපනාමයාගේ වෑතෝරූ (ගුහ්‍යම) පියකරූ, ප්‍රියකරුවූ; පුලුලුතුල, පෘථුලවූශ්‍රොණී නැමති; බිම, භූමියෙහි සුසැදි, සුසජ්ජිතවූ; පුවතර, මහත්වූ; රඹතුරූසිරිය, රම්භා වෘක්‍ෂශොභාව; කියලිය, ප්‍රකාශකළේය.

105 වදින සුරන්   කිරුළග බැඳි මුරුතම්   ලේ
උදුල රසින්   පිවිතුරූ රතු පතුල් න   ලේ
මඩන බැවින්   වෙහෙසටපත් තඹුරූ කැ   ලේ
මිදෙනලෙසින්   හැසිරෙන වැනි සිලිල් තෙ   ලේ

105 වදින, නමස්කාරකරන්නාවූ; සුරන්, දෙවියන්ගේ; කිරුළග, ක්‍රීටාග්‍රයන්හි; බැඳි, බඳනාලද; මුරුතමලේ, පද්මරාගමාණික්‍යයෙහි; උදුල, උජ්ජ්වලිතවූ; රසින්, රැශ්මියෙන් පිවිතුරූ, පවිත්‍රවූ; රතුපතුල්තලේ, රක්තපාදතලයන්; මඩන බැවින්, මර්දනයකරණ හෙයින්; වෙහෙසටපත්, විහිංසනයට ප්‍රාප්තවූ; තඹුරූකැලේ, තාමරසසමූහයා; මිදෙනලෙසින්, නිදහස්වන පරිද්දෙන්; සිලිල්තෙලේ, ජලතලාවන්හි; හැසිරෙණවැනි, සංචාරණය කරන්නාක්මෙනි.

106 දි ය ත   සතන් තුටුකරවන සොමි ගති   නි
උදි ත   විසෙක කිංකරු දශ විකරනි   නි
අන ත   රුසිරු යුතු එසුරිඳු සඳ තෙදි   නි
වණ ත   අනත මය සුරු දනසක් වති   නි

106 දියත, ලොකයෙහි; සතන්, සත්වයන්; තුටුකරවණ සතුටුකරවන්නාවූ; සොමිගතිනි, සෞම්‍යශරීරයකින්ද; විසෙක එක්විසෙක; කිංකරු, භෘත්‍යකාරවූ; දසවිකරනිනි, දශවිකාරයකින්ද; උදිත, උද්දිපනවූ; සඳතෙදිනි, සඳතෙජසින්; යුතු, යුක්තවූ; එසුරිඳු, ඒශ්වරෙන්ද්‍රයාගේ; අනතරුසිරු, අත්තවුරුපශ්‍රිය; වණත, වර්ණනාකරන්නෝ; දනසක් වතිනි, සහශ්‍රවක්ත්‍රයෙන්; සුරු, සමර්ථවූයේ; අනතමය, අනන්ත නම් නාග රාජයා මය.

107 සි රි න්   ඉසුරු කරවන සිහිකල විශ   ස
එ සි න්   සුරබි සුරතුරු සරිවෙද කෙලෙ   ස
ලෙවන්   විඳින දුක් සිඳිනෙත් මුලින් පි   ස
ඉ සි න්   නියම කල පමණිනි බෙහෙත් රැ   ස

107 සිහිකලවිශස, සිහිකලාවූ කතෙණ්හිම; සිරින්, ඓශ්වර්‍ය්‍යයෙන්; ඉසුරුකරවන, (ලොවැස්සාව) ඊශ්වර කර වන්නාවූ; එසින්, ඒකාරණයම කරණකොට ගෙණ; සුරබි, කාමධෙනුය; සුරතුරු, දිව්‍යවෘක්ෂය යන මේහු; කෙලෙස, කවර පරිද්දෙකින්ද; සරිවෙද, සමානවේද්ද; ලෙවන්, ලොවැස්සන්; විඳින, විඳින්නාවූ; දුක්, (රෝග) දුඃඛයන්; පිස, පිඤ්ජනයකොට, මුලින්සිඳිනෙත්, මුලොච්ඡෙදනකරණහෙයින් බෙහෙත්රැස, ඖෂධරාශිය; ඉසින්, ඍෂීන් විසින්; නියම කලපමණිනි, නියමකරණලද ප්‍රමාණයෙන් මය.

108 මි නේ   ගැඹුරු යස සඳතෙද බල සතු   රු
ර ණේ   පතල ජයසෙන් කැමති නතතු   රු
ම නේ   සර පැතුම්ව දෙන බැමින් ස   රු
පි නේ   මහිම මැසි සතකල ඒසුරම්   රු

108 ගැඹුරු, ගම්භීරවූ; මිනේ, ප්‍රඥාවය; යස, කීර්තිය; සඳතෙද, සඳතෙජසය; බල, වික්‍රමය; සතුරුරණේ, ශත්‍රු

පුබන්නේනි; පතලජය, විහත්වුජයගැණීමය; සෙන්, සේනාවය කැමතිනානතුරු, අසම්භාවස්ථානාන්තරය (යනාදිය) මෙනේ කර, සිහිකොට; පැතුම්ට, ප්‍රාර්ථනා කලකල්හි; දෙනබැවින්, දුනයකරණයෙහින්, එසුරවිරු, ඒසුරවීරයා; සනකල, සව යාවිහින් කරණලද්දාවූ; සරු, සාරවූ; පිනේමහිමමැහි, පුණ්‍ය යාගේ ආශ්‍රයමූලයක් මය.

109 නි ත ර   නිතර වෙහෙසට පැමිණි සුර ව   ර
න ත ර   නොවී විත් කරදර කරණව   ර
ප ත ර   රජකුලෙහි පිදු මැරුව දසසි   ර
එ සු ර   පති හිමින් වදු සිරිපා තඹ   ර

109 නිතරනිතර, නොකඩවම; වෙහෙසව,(රාවණාගෙන් වන්නාවූ) විහිංසනයව; පැමිණි, සම්ප්‍රාප්තවූ; සුරවර, දිව්‍ය සමූහයා; නතරනොවී, (තමතමන්ගේ දිව්‍යභවනවල) නොනැවතී; විත්, ඇවිත්; කරදරකරණවර, කරදරකරන්නාවූ කාලයෙහි; පතර, මහත්වූ; රජකුලෙහිපිදු, රාජවංශයෙහි ඉපද; දසසිර, දශශීර්ෂයා; මැරුව, මැරුවාවූ; එසුරපති හිමින්, ඒදිව්‍යරාජස්වාමියාගේ; සිරිපාතඹර, ශ්‍රීපාදපද්මය; වදු, නමස්කාර කර.

110 නමකොට   මෙලෙස දුටුසඳ අවසර විග   ස
සිහි කොට   මපවසන මෙපවත් ඇති විල   ස
තිගු කොට   පලමු සුරිඳුට සිවැ එකත් ප   ස
ගිය ක ට   සුතුව කියපිය උපදින විල   ස

110 මෙලෙස, මෙපරිද්දෙන්; නමකොට, නමස්කාර කොට; අවසරවිගස, අවකාශක්ෂණය; දුටුසඳ, දුටුකල්හි; මපවසන, මාවිසින්කියන්නාවූ; මෙපවත්, මේ ප්‍රවෘත්තිය; ඇතිවිලස, තත්වූපරිද්දෙන්; සිහිකොට, සමෘතිමත් කොට; පලමු, ප්‍රථමයෙන්; සුරිඳුට, සුරේන්ද්‍රයාට; තිගුකොට, ස්තුති කොට; එකත්පසසිටැ, එක් පාශ්වයෙක්හි අවස්ථානයකොට; ගියකටයුතුව, (තා) ගියකාතිව්‍යය; පියඋපදිනවිලස, ප්‍රීතිඋප දින පරිද්දෙන්; කිය, කථනය කර.

111 සරද අඹර සතරත යක්වට නැබ ල
සිරිද ර ගනවණ මිනියත් වලලු දු ල
පබද තොයද මහසත් විදුකර කම ල
සැරද සරද දද රද දියබඳ පබ ල

111 සරද, සාරදවූ; අඹර, අකාශයයෙදෝහෝ නොහොත්
(පීත) අම්බරඇති; සතරත, සතරදිසාභාගයන්දෝහෝ නො
හොත් චතුහිසතඇති; නැබල, මහත්වූ; සක්වව, චක්‍රවාටය
දෝහෝ නොහොත්; වට, වෘතවූ; සක්, සඞ්ඛයෝ චක්‍රායුධ
ඇති; සිරිදර, ඓශ්වර්‍ය්‍ය දරන්නාවූ දෝහෝ නොහොත්;
සිරි, ශ්‍රීවිභූතියහෝ ශ්‍රීකාන්තාව; දර, දරන්නාවූ; ගන, මේඝ
සූවහා; වණ, විරහිණීන් දෝහෝ නොහොත්; ගනවණ,
මේඝවර්ණ ඇති; දුල, බබලන්නාවූ; මිණි, මාණික්‍යයන්හා
සත්වලලු, සපන(සුවපවිත)වලයන්දෝහෝ නොහොත්; සත්
මිණි, සප්තවිධමාණික්‍යමයවූ; වලලු, නූපුරයන්ඇති; පබද,
ප්‍රකාශිතවූ; තොය, (චතුස්සාගරසඞ්ඛ්‍යාත)ජලයෙන් දෝහෝ
නොහොත් කරුණාවෙන්; අද, ආද්‍ර; මහසත්, තිමිතිමිංග
ලාදි මහාසත්වයන්ඇති දෝහෝ නොහොත් මහාසත්වවූ; විදු,
විද්‍යුල්ලතාවන් ඇති දෝහෝ නොහොත්; (චතුෂ්ෂෂ්ටිකලා)
විද්‍යාවන්දන්නාවූ; කමලකර, සූර්‍ය්‍යාඇත්තාවූ දෝහෝ නො
හොත්; කමලඅකර, පද්මාකරවූ; සරද ඳද රද, ශරච්චන්ද්‍ර
යාදෝහෝ නොහොත් අතිශය ප්‍රභාසම්පන්න ගරුඬ (රාජ)
යන්ඇති; පබඳ, ප්‍රබලවූ; බඳ, (මෙරුපර්වතාදී) දෙහ ඇති;
දිය, ජගත්තෙම දෝහෝ නොහොත්; දියබඳ, විෂ්ණුද්වය
රාජය; සැරද, චිරාත්කාලයක් ජීවත් වෙසිවා.

112 නිතර පවර කවයුතු යුතු දනන් සි ත
බැහැර උතන් මේයසි රීසිලෙසින්ද ත
විතර නොවන නුවනැති සිරි හිමින් අ ත
විතර කර රකින තමයුග නුවන් යු ත

112 නිතර, නිරන්තරයෙන්; පවර, උතුම්වූ; කවයුතු,
කතිව්‍යයන්හි; යුතු, යුක්තවූ; දනන්, ජනයන්ගේ; සිත, චිත්
තය; බැහැරඋතන්, පිටතසිටිනේවී නමුත්; මේයසි, මෙයා
කාරයසි; රීසිලෙසින්, රුචිවූපරිද්දෙන්; දත, දන්නාවූ; විතර
නොවන, අප්‍රමානවූ; නුවනැති, නුවන ඇත්තාවූ; හිමින්
අත, ස්වාමියාඅයත්වූ; සිරි, ඓශ්වර්‍ය්‍යය; විතරකර, ප්‍රමාණ
කොට; තමයුග නුවන් යුත, තමන්ගේ යුග්ම නෙත්‍රා පරිද්
දෙන්; රකින, රක්‍ෂාකරන්නාවූ.

113 තෙද කිත් ඇදී නා මහලිපිකරු සඳ පව ර
බ ල ව ත් පඬුරු දී සිහිකර කර නිත ර
ඔබ වෙ ත් පැමිණ කියනුව තී එනොරතු ර
ඇසුවො ත් මැනවි ඔහුවෙතැ මෙත් කුළුණු ක ර

113 පවර, ප්‍රවරවූ; මහලිපිකරුසඳ (**මෝනිස් සිල්වා** අප්පුහාමිනම්වූ) ප්‍රධානලිපිකාරචන්ද්‍රයා: තෙදකිත්ඇදීන, (ඔහුවහන්සේගේ)තෙජෝකීර්ත්‍යාදිගත; බලවත්, බොහෝවූ; පඬුරුදී, (පූජා)ප්‍රාභෘතදානයකොට; නිතර, නිරන්තරයෙන්; සිහිකරකර, සම්ස්මරණකොට කොට; ඔබවෙත්පැමිණ, ඔබ වහන්සේකරාඅවුත්; කියනුවක්, කථනයකරණ පරිද්දෙන් තිබෙවූ; එනොරතුර, ඒප්‍රවෘත්තිය; ඔහුවෙතැ, ඔහුකෙරෙහි; මෙත් කුළුණු කර, මෛත්‍රී කරුණා උපදවා; ඇසුවොත්, ශ්‍රවණය කළ හොත්; මැනවි, යහපති.

114 සතර මහ සයුරේ– එතර දක නැත නැමිනි
වැජඹි ඇතුගලපුරවර– කෙලෙස් හර සිරි ඉසුලු

114 සතර, චාතුර්‍ය්‍යනැමති; මහසයුරේ, මහාසාගරයාගේ; එතර, පරතීරය; නැතනැමිනි, නුවණනැමතිනැවෙන්; දක, දර්ශනයකොට; ඇතුගලපුරවර, හස්ති ශෛල පුරප්‍රවරය නැමති; කෙලෙස්, කෛලාස කූටයෙහි; වැජඹි, විජෘම්භමානවූ; හරසිරි, ඊශ්වරසොභාව; ඉසුලු, උවහනයකලාවූ.

115 තෙදකිරණින් රුදුඝොර ගනඳුරු පත ර
දුරු කරමි න් සුසිරිත අලුකර නිත ර
නොමදසිය න් සියපත් කුල කමල ක ර
බබලව මි න් පොබකල නුබමිණ අයු ර

115 තෙද, තෙජස්නැමති; කිරණින්, රශ්මියෙන්; රුදු, රෞද්‍රවූ; ඝොර, ඝෝරනැමති; පතර, මහත්වූ; ගනඳුරු, ඝනාන්ධකාරය; දුරුකරමින්, දුරීභූතකරමින්; නිතර, නිරන්තරයෙන්; සුසිරිත, සුචරිතයනැමති; අලුකර, ආලෝකය කොට; කුල, වංශනැමති; කමලකර, පද්මාකරයෙහි; නොමද, බොහෝවූ; සියන්, සවකීයයන්නැමති; සියපත්, ශත පත්‍රයන්; බබලවමින්, උද්දීපනකරමින්; පොබකල, ප්‍රබුද්ධ කලාවූ; නුබමිණ අයුර, සූර්‍ය්‍යයාවැනිවූ.

116 සෑ සි  තුන්ලෙව් ගුරු මුනිඳහමැ සි  රූ
නෑ සි  ය නෙක දහත් බිම කප්තුරෙක ගු  රූ
බී සි  ජී . . . . මුදලිඳුව ග  රූ
පෑ සි  ය නොහැකි වෙච්චය ඉසුරෙන් ඉඳු  රූ

116 සෑසි, සාක්‍යසිංහවූ; තුන්ලෙව්ගුරු, ත්‍රෛලොක්‍ය මාන්‍යවූ; මුනි, සර්වඥත්වඥානයන්ගේ; දහම්, ධර්මය; ඈසිරූ ආශ්‍රයකළාවූ; නෙක, බොහෝවූ; සියකෑදහත්, සවකීය ඥාතිජනයන් හැමති; බිම, භූමියෙහි (සජ්ජිතවූ) කප්තුරෙක ගුරූ, කල්පවෘක්ෂයක්වැනිවූ; ගරූ, ගෞරවාන්විතවූ; බි සී ජී . . . . මුදලිඳුව, එනම් මුදලිතුමාව; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යී කරණකොට ගෙණ; ඉඳුරූ, ඉන්ද්‍රයා; පෑසිය නොහැකිවෙච්චය, සමාන කළ නොහැක්කේ මැයි.

117 අ නේ  පිඹුලෙසින් මොහු මුනි සසුන් ගෑ  ණ
පි නේ  අගය දුන සිරි හිමිකර දෙමි  න
ගු ණේ  මහිමයෙන් සව්සත සතන්ගෙ  න
සෙනේ  තදින් බැඳ සිල්රකි නුවන්මෙ  න

117 මොහු, මේඋපාසකයා; පිනේඅගය, පුණ්‍යයාගේශ්‍රේෂ්ඨතාවය; දුන, ජනනයකොට; මුනිසසුන්ගෑණ, සම්බුද්ධශාසනයාගේ චිරස්ථිතියසඳහා; අනේපිඬුලෙසින්, අනාථ පිණ්ඩිකනම් සිටුහුමෙසින්; සිරි, ඓශ්වර්‍ය්‍යය; හිමිකර, අයත්කොට; දෙමින, දානයකරමින්, ගුණේමහිමයෙන්, ගුණානුභාවයෙන් සව්සත, සකලසත්ත්වයන්ගේ; සතන්ගෙණ, සිත්ගෙණ; තදින්, තරයේ; සෙනේබැඳ, ආලයකොට; නුවන්මෙන, (සවකීය) නෙත්‍රයන්පරිද්දෙන්; සිල්රකි, ශීලසංරක්ෂණයකෙරේ.

118 නොමද  පැහිර ඉතිරෙණ මොහු යස රැස  ට
ස ර ද  තරිඳු තිවෙහිනම් අයුරුකො  ට
නි බ ඳ  එකසෙ ඇහැගැනෙනා ලොව හැම  ට
එ ස ඳ  කලින්කල අඩුවෙන්නේ කුම  ට

118 පැහිර, විසනිර්ව; ඉතිරෙණ, අතිරික්ත වන්නාවූ; නොමද, බොහෝවූ; මොහුයසරැසට, මොහුගේයශෝරශ්මිව සරදතරිඳු, ශරච්චන්ද්‍රයා; අයුරුකොට, සමානකොට; තිවෙහිනම්, තිබේවීනම්; ලොවහැමට, ලෝකවාසීසියල්ලට; නිබඳ, නිරන්තරයෙන්; ඇහැ ගැනෙනා, දෘශ්‍යමානවන්නාවූ; එසඳ, ඒචන්ද්‍රයා; කලින්කල, වාරයෙන්වාරය; අඩුවෙන්නේ, ඌනවන්නේ; කුමට, කුමක්නිසාද?

119 ලක ඹ ර නැග බබලන පිරිසිදුව නී ති
පුව ත ර මෙහිමිගෙ දනගන කුල බලැ ති
සිඳු ක ර දත් වැසිකැල සෙද විතර නැ ති
දුරු ක ර දුම් දිළිඳුත් දුක් ගිමන් අ ති

119 ලකඹර, ලඞකානැමතිආකාශයෙහි; නැග, උද්ගතව; පිරිසිදුව, පරිශුඬව; බබලන, භ්‍රාජමාන වන්නාවූ; මෙහිමිගෙ, යෞක්තමුදලිතුමාගේ; බලැති, බලවත්වූ; දනගන කුල, වස්තු නැමති මෙඝයුවය; විතර නැති, අප්‍රමාණවූ; දත් වැසිකැල, දන නැමති වර්ෂාරශිය; සිඳුකර, සිඳකොට; දිළිඳුන්, දරිද්‍රයන්ගේ; අති, බොහෝවූ; දුක්ගිමන්, දුඃඛනැමති ග්‍රීෂ්මය; දුරුකර දුම්, දූරීභූත කලේයි.

120 ස ම ර සදිසි තුනුරුසිරු යුත් නිම ල
සුනෙ ර හරණ තරසර ගුණ දූරු නිස ල
ප ව ර මෙමුදලිඳු සඳ නුවනින් විපු ල
මෙත ර ලොවට බට සුරගුරු වැනි මෙක ල

120 සමරසදිසි, අනඞගයා සමානවූ; නිමල, නිර්මලවූ; තුනුරුසිරුයුත්, ශරීරරූපශ්‍රියෙන් යුක්තවූ; සුනෙර හරණ, මේරුපර්වතයවැනි; නිසල, නිශ්චලවූ; තරසරගුණදූරු, සපිර සාරගුණ ඉසුලූ; පවර, ප්‍රවරවූ; මෙමුදලිඳුසඳ, මේමුදලිඋතුමා; විපුල, මහත්වූ; නුවනින්, ඥානය කරණකොට ගෙණ; මෙකල, මේකාලයෙහි; මෙතර ලොවට, මේමනුෂ්‍යලෝකයට; බට, බැස්සාවූ; සුරගුරුවැනි, බෘහස්පති වැන්නේයි.

121 ද රු ණු දුසිරි දුරුකරවා රුතිලෙසි න
ප මු ණු වන බැවින් වැඩ සතහට නොමි න
කු ලු ණු ගුණැති මොහු සහ නෑසිය සොඳි න
ර කි නු මැනවි නිරතුරු ආසිරි දෙමි න

121 දරුණු, භයානකවූ; දුසිරි, දුශ්චරිතයන්; රුතිලෙසින, රුචිවූපරිද්දෙන්; දුරුකරවා, දූරීභූතකරවා; සතහට, සත්වයානට; නොමින, බොහෝසේ; වැඩපමුණුවනබැවින්, අභිවෘඬිසලස්වනහෙයින්; කුලුණුගුණැති, කරුණාගුණයෙන් යුක්තවූ; මොහුසහ, මේඋතුමාසහා; නෑසිය, ඥාතිසමූහයාද; නිරතුරු, නිරන්තරයෙන්; සොඳින, යහපත්සේ; ආ, ආයුෂද; සිරි, ඓශ්වර්යයද; දෙමින, දෘනයකරමින්; රකිනු මැනවි, රක්ෂාකරණු මැනවි.

122 සු රි ඳු න් හට සැලකර ඇළි ඔබ් හසු න
ස් ර ගි න්, වැඳ පැදකුණුකොට සහ තොසි න
ඳ කි මි න් සිරිදෙවියන් අවසර රුගෙ ණ
අ ය දි න් සකිසඳ කියමින් මෙමලෙසි න

122 මෙහි සුතා, මේ (යථෝක්ත) සම්බන්ධයයි: **සුරිඳුන්හට,** (උපේන්ද්‍රනම්) සුරේන්ද්‍රයාට; සැලකර, විඥාපනය කොට; ඇළි, නැවත; සිරගින්, ශීඝ්‍රයෙන්; වැඳ, නමස්කාර කොට; සහ තොසින, සන්තෝෂයෙන්; පැදකුණුකොට, ප්‍රදක්ෂිණකොට; සිරිදෙවියන්, (සුරේන්ද්‍රයා හට) අග්‍රමහෙසිකාවවූ ශ්‍රීකාන්තා දෙවින්; දකිමින්, දක්ෂණයකරමින්; අවසරරුගෙණ, අවකාශ ගෙණ; සකිසඳ, මිත්‍රොත්තමය; මෙම ලෙසින, මෙම පරිද්දෙන්; කියමින්, කථනයකරමින්; අයදින්, ආයාචනාකරන්.

123 පි ය වී ගොසින් මෙගමන අදහස සිය ල
සි ය කාරියෙව් සිදුකර කුලුණෙන් පත ල
කි ය වා නොමින් තොප යසරුස මෙදියතු ල
සි ය වාසියක් සමගින් පවතුව කිර ල

123 කිරල, කාරණ්ඩවය; පියවි, ප්‍රියවී; **මෙගමනගොසින්,** මේ ගමනයෙන්; සියල අදහස, සකල අභිප්‍රාය; **සියකාරියෙව්,** තමාගේකටයුත්තක්මෙන්; **පතලකුලුණෙන්, මහත්** කරුණාවෙන්; සිදුකර, සිද්ධකොට; **තොපයසරුස, තොපගේ** යශෝරාශිය; **මෙදියතුල,** මේජගදභ්‍යන්තරයෙහි; **නොමින්,** බොහෝසෙයින්; **කියවා,** කථනයකරවා; **සියත්සමගින්,** ස්වකීයයන්හා එක්ව; **සියවා,** ශතවර්ෂයක්; **පවතු, ජීවත්වෙව.**

— නි මි —